අ.පො.ස (උ.පෙළ) විභාගය - 2014

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2014

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

ව්‍යාපාර අධ්‍යයනය

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2014

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2014 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 207304 ක් පාසල් අයදුම්කරුවෝ ද 40072 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2014 විභාගයේ ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව ආයක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා මෙම කාර්ය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2016 දෙසැම්බර් 01
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

උපදේශකත්වය	:	ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රී අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සම්බන්ධීකරණය	:	ලසික සමරකෝන් සහකාර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සංස්කරණය	:	ආචාර්ය යූ. එල්. ටී. පී. ගුණසේකර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කැළණිය විශ්ව විද්‍යාලය ආචාර්ය එම්. ඒ. කේ. ශ්‍රියාලතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	ඩබ්. එම්. සුදුබණ්ඩා වාණිජ - ගුරු උපදේශක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පස්සර. ඩබ්ලිව්. එම්. ඒකනායක ගුරු උපදේශක කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර. ඩබ්ලිව්. ඩී. රංජිත් ජයනාද ගුරු සේවය I ශාන්ත පීතර විද්‍යාලය, කොළඹ 04. ෂෙරීන් කණ්ඩම්බි බප/ජය/ අනුලා විද්‍යාලය, නුගේගොඩ. වසන්ත ගාමිණී අබේසිංහ විශාඛා විද්‍යාලය, කොළඹ 05.
පරිගණක පිටපත සැකසුම	:	කේ.ඒ.ඩී. තිලානි ලක්මාලි රාජ්‍ය කළමනාකරණ සහකාර ටී. දර්ශිකා නිලුපුලී පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු
පිටකවරය නිර්මාණය	:	වයි.එස්. අනුරාධි සංවර්ධන නිලධාරී

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1 විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 ව්‍යාපාර අධ්‍යයන විෂයෙහි අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

II කොටස

2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 9

2.1.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා) 10

2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 14

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ 15

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 16

2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා 17

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ අංක 31- 50 තෙක් ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18

2.1.8 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ 26

2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31-50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය 27

2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31-50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා 28

2.2 **II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 29

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 30

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 65

III කොටස

3 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 66

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 67

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි අභිමතාර්ථ

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශිෂ්‍යයා,

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම හා සම්බන්ධ ගැටලුවලට, ආයතන හෝ සංවිධාන පදනම් කරගෙන විසඳුම් සෙවිය හැකි ආකාර පිළිබඳ ව නිපුණතා වර්ධනය කර ගනියි.
- ගතික ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීම මගින් එයට අනුවර්තනය වීමට අවශ්‍ය කුසලතා ලබා ගනියි.
- ව්‍යාපාර හා ඊට සම්බන්ධ උපකාරක සේවා පිළිබඳ ව ලබාගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිත කරයි.
- ව්‍යාපාර හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම අධ්‍යයනය කිරීමටත්, සංකීර්ණ විෂය කරුණු සරල ව ග්‍රහණය කර ගැනීමටත් නිපුණතා වර්ධනය කර ගනියි.
- ව්‍යවසායකත්ව හා කළමනාකරණ කුසලතා වර්ධනය කර ගනියි.
- ව්‍යාපාර පද්ධතියක ශ්‍රිත අතර සමෝධානිත බව පෙන්වා දෙයි.
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාරවල නිරත වීමට අවශ්‍ය මූලික නිපුණතා ලබා ගනියි.
- ශ්‍රී ලංකාව තුළ යහපත් ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආකල්ප ගොඩනගා ගනියි.
- සැලසුම් සහගතව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා ලබාගනියි.
- වෘත්තීය භූමිකාවල සාර්ථක ව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා ගනියි.
- සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා කළමනාකරණය හා නූතන තාක්ෂණය භාවිත කිරීමේ කුසලතා වර්ධනය කරගනියි.
- උසස් අධ්‍යාපනයට යොමු වීම උදෙසා ප්‍රවේශයක් ලබා ගනියි.

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	49217	4206	53423
දෙමළ	8374	1073	9447
ඉංග්‍රීසි	1709	677	2386
එකතුව	**59300**	**5956**	**65256**

වගුව 1

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	6074	10.24	317	5.32	6391	9.79
B	12162	20.51	816	13.70	12978	19.89
C	20261	34.17	1682	28.24	21943	33.63
S	16231	27.37	1983	33.29	18214	27.91
F	4572	7.71	1158	19.44	5730	8.78
එකතුව	**59300**	**100.00**	**5956**	**100.00**	**65256**	**100.00**

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	8253	1200	14.54	1874	22.71	2605	31.56	1999	24.22	7678	93.03	575	6.97
2. ගම්පහ	5120	650	12.70	1089	21.27	1681	32.83	1360	26.56	4780	93.36	340	6.64
3. කළුතර	2431	329	13.53	491	20.20	791	32.54	645	26.53	2256	92.80	175	7.20
4. මහනුවර	2796	380	13.59	528	18.88	884	31.62	764	27.32	2556	91.42	240	8.58
5. මාතලේ	763	56	7.34	149	19.53	258	33.81	231	30.28	694	90.96	69	9.04
6. නුවරඑළිය	1066	83	7.79	213	19.98	368	34.52	307	28.80	971	91.09	95	8.91
7. ගාල්ල	2399	311	12.96	516	21.51	757	31.55	637	26.55	2221	92.58	178	7.42
8. මාතර	1609	157	9.76	293	18.21	524	32.57	467	29.02	1441	89.56	168	10.44
9. හම්බන්තොට	960	83	8.65	161	16.77	338	35.21	275	28.65	857	89.27	103	10.73
10. යාපනය	1241	72	5.80	204	16.44	419	33.76	400	32.23	1095	88.24	146	11.76
11. කිලිනොච්චි	172	14	8.14	45	26.16	62	36.05	36	20.93	157	91.28	15	8.72
12. මන්නාරම	193	7	3.63	36	18.65	78	40.41	54	27.98	175	90.67	18	9.33
13. වව්නියාව	312	27	8.65	57	18.27	91	29.17	105	33.65	280	89.74	32	10.26
14. මුලතිව්	154	6	3.90	31	20.13	62	40.26	41	26.62	140	90.91	14	9.09
15. මඩකලපුව	751	56	7.46	169	22.50	279	37.15	185	24.63	689	91.74	62	8.26
16. අම්පාර	987	46	4.66	162	16.41	350	35.46	298	30.19	856	86.73	131	13.27
17. ත්‍රිකුණාමලය	580	48	8.28	105	18.10	186	32.07	161	27.76	500	86.21	80	13.79
18. කුරුණෑගල	2519	218	8.65	437	17.35	907	36.01	762	30.25	2324	92.26	195	7.74
19. පුත්තලම	1335	133	9.96	299	22.40	464	34.76	334	25.02	1230	92.13	105	7.87
20. අනුරාධපුරය	1160	90	7.76	248	21.38	400	34.48	324	27.93	1062	91.55	98	8.45
21. පොළොන්නරුව	583	76	13.04	112	19.21	189	32.42	149	25.56	526	90.22	57	9.78
22. බදුල්ල	1412	117	8.29	221	15.65	469	33.22	462	32.72	1269	89.87	143	10.13
23. මොනරාගල	622	43	6.91	102	16.40	241	38.75	183	29.42	569	91.48	53	8.52
24. රත්නපුරය	1992	171	8.58	459	23.04	674	33.84	500	25.10	1804	90.56	188	9.44
25. කෑගල්ල	1290	173	13.41	292	22.64	403	31.24	322	24.96	1190	92.25	100	7.75
සමස්ත දිවයින	**40700**	**4546**	**11.17**	**8293**	**20.38**	**13480**	**33.12**	**11001**	**27.03**	**37320**	**91.70**	**3380**	**8.30**

වගුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91-100	6	0.01	65256	100.00
81-90	1109	1.70	65250	99.99
71-80	8195	12.56	64141	98.29
61-70	14628	22.42	55946	85.73
51-60	15774	24.17	41318	63.32
41-50	13817	21.17	25544	39.14
31-40	8364	12.82	11727	17.97
21-30	2880	4.41	3363	5.15
11-20	422	0.65	483	0.74
01-10	61	0.09	61	0.09
00-00	0	0.00	0	0.00

වගුව 4

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 65256 දෙනා අතුරෙන්, 31-40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 8364කි. එය ප්‍රතිශතයක් වශයෙන් 12.82කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 11727ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 17.97කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 06 සහ 41 වන ප්‍රශ්නවලටය. එහි ප්‍රතිශතය 95%කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 25 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 6%කි.

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් ගතහොත්, පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේදී 01 වන ප්‍රශ්නය 99%ක් පමණ පිරිසක් තෝරාගෙන ඇති අතර 06වන ප්‍රශ්නය තෝරාගත් පිරිස 43%ක් පමණ වේ.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් මෙහි 01 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 16 - 20 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 11%ක් පමණ වේ. 11 -15 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 40%ක් පමණ වේ. 6 -10 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 37% ක් පමණ වේ. 0-5 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 12% ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)


අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2014
32 - ව්‍යාපාර අධ්‍යයනය - II පත්‍රය - II කොටස
ප්‍රශ්නවල පහසුතා දර්ශකය
1.0
0.9
0.8
0.7
0.6
0.5
0.4
0.3
0.2
0.1
0.0
ප්‍රශ්න අංකය - කොටස් හා අනුකොටස්

ප්‍රස්තාරය 4.2

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 02 කි. මුළු ලකුණු 100කි.

* 1 - 30 දක්වා බහුවරණ ප්‍රශ්න 30කින් ද 31 - 40 දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පිරවීමේ ප්‍රශ්න 10කින්ද, 41 - 50 දක්වා නිශ්චිත පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින්ද සමන්විතය.

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අපේක්ෂිතය.

* එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

2.1.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා)

1. පහත සඳහන් දෑ අතුරෙන් ව්‍යාපාරයක ප්‍රධාන අරමුණක් ලෙස සැලකිය **නොහැකි** කරුණ කුමක් ද?
(1) ලාභ උපරිම කිරීම (2) වෙළෙඳපොළ කොටස වැඩිකර ගැනීම
(3) රැකියා අවස්ථා උපරිම කිරීම (4) වෙළෙඳපොළේ රැඳී සිටීම
(5) විකුණුම් උපරිම කර ගැනීම (......)

2. විවිධ පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට බලපාන හේතූන් කිහිපයක් පහත දැක්වේ.
A - ලාභය B - ව්‍යාපාරික වර්ධනය C - වෙළෙඳපොළ කොටස
D - ගත් තීරණවල සාර්ථකත්වය E - වැටුප F - රැකියාවේ ස්ථාවරභාවය
G - උසස්වීම් H - තනතුරේ සංවර්ධනය
ඉහත සඳහන් දෑ අතුරෙන් කළමනාකරුවන් පමණක් ව්‍යාපාර කෙරෙහි උනන්දුව දක්වන හේතූන් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, B, D, H (2) A, C, D, H (3) A, D, E, H (4) B, D, F, H (5) D, E, F, G (......)

3. පහත දැක්වෙන්නේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරනු ලබන පාරිසරික බලවේග කිහිපයකි.
A - ගනුදෙනුකරුවන් C - තරගකරුවන් E - ආදේශන භාණ්ඩ නිෂ්පාදකයින්
B - සමාජ සංස්කෘතික සාධක D - සැපයුම්කරුවන් F - තාක්ෂණික සාධක
මේ අතුරෙන් ආසන්න පාරිසරික බලවේග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, B, C, D (2) A, C, D, E (3) A, C, D, F (4) B, C, D, E (5) B, C, D, F (......)

4. ව්‍යාපාරයක් විසින් විවිධ පාර්ශවකරුවන් වෙත ඉටු කළ යුතු සමාජ වගකීම් කිහිපයක් පහත සඳහන් වේ.
A - සාධාරණ වීම B - සමානාත්මතාව
C - බදු ගෙවීම D - ආයෝජනයට සාධාරණ ඉපයීමක්
E - රැකියා සුරක්ෂිත බව F - රැකියා අවකාශ සැලසීම
G - කාර්යක්ෂම හා අවංක කළමනාකරණය H - ප්‍රජා සත්කාර සේවා
I - අපද්‍රව්‍ය කළමනාකරණය J - සෞඛ්‍ය හා ආරක්ෂක පහසුකම්
මේ අතුරෙන් ව්‍යාපාරයක් විසින් සමාජයට පමණක් ඉටු කළ යුතු සමාජ වගකීම් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, B, E, J (2) A, B, H, J (3) B, C, F, I (4) C, D, G, I (5) C, F, H, I (......)

5. පහත වගුවේ **X** තීරුවේ ව්‍යාපාර හා රජයට අයත් කාර්යයන් කිහිපයක් ද, **Y** තීරුවේ එම කාර්යයන්වල ප්‍රතිඵල ද දැක් වේ.

X	Y
A. රජය ව්‍යාපාරවලට බලපෑම් කරන්නේ	1. ආර්ථිකයේ මුදල් සැපයීම කෙරෙහි ය.
B. රජයේ අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාර සහාය වන්නේ	2. තරගකරුවකු වීමෙනි.
C. රජයේ පිස්කල් ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපෑම් ඇති කරන්නේ	3. දේශීය අමුද්‍රව්‍ය භාවිත කිරීමෙනි.
D. රජයේ මූල්‍ය ප්‍රතිපත්ති බලපෑම් ඇති කරන්නේ	4. භාණ්ඩ අලෙවිය වැඩිවීම නිසා ලාභ වැඩිවන හෙයිනි.
E. ව්‍යාපාරිකයින්ට පාරිභෝගික ආරක්ෂණය වැදගත් වන්නේ	5. නිෂ්පාදනයන් මත විවිධ බදු පැනවීම මගින් භාණ්ඩ මිල ඉහළ යාමට සැලැස්වීමෙනි.

X හා Y තීරුව නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?
(1) A-5, B-2, C-4, D-1, E-3 (2) A-5, B-3, C-2, D-1, E-4 (3) A-2, B-3, C-5, D-4, E-1
(4) A-2, B-3, C-5, D-1, E-4 (5) A-3, B-2, C-5, D-4, E-1 (......)

6. පහත දැක්වෙන්නේ විවිධ ව්‍යාපාර වර්ගවල වාසි කිහිපයකි.
A - පහසුවෙන් ආරම්භ කළ හැකි වීම B - විශාල ප්‍රාග්ධනයක් සම්පාදනය කරගත හැකි වීම
C - ස්වාධීන තීරණ ගත හැකි වීම D - ව්‍යාපාර කළමනාකරණය සඳහා දක්ෂතා ඇති අය බඳවාගත හැකි වීම
E - ව්‍යාපාරය විසුරුවා හැරීම පහසු වීම F - වගකීම වැඩිදෙනෙකු අතර බෙදාගත හැකි වීම
මේ අතුරෙන් කේවල ස්වාමි ව්‍යාපාරයකින් ලැබෙන වාසි පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, C, E (2) A, E, F (3) B, D, E (4) B, D, F (5) C, D, E (......)

7. පහත සඳහන් දෑ අතුරෙන් වරලත්හිමියා විසින් වරලත්ලාභියා වෙත සපයනු **නොලබන** පහසුකම කුමක් දැ'යි තෝරන්න.
(1) සිය වෙළෙඳ නාමය භාවිතයට අවසර දීම (2) අලෙවිකරණ සහාය ලබාදීම
(3) මූල්‍ය පහසුකම් ලබාදීම (4) තාක්ෂණ සහාය ලබාදීම
(5) ඕනෑම සැපයුම්කරුවකුගෙන් භාණ්ඩ මිල දී ගැනීමට අවසර දීම (......)

8. A - තමන්ගේ හැකියාවන් උපරිම අන්දමට භාවිත කිරීමට ඇති කැමැත්ත
B - සමාජයේ පවත්නා කිසියම් සමාජ ප්‍රශ්නයක් විසඳීම සඳහා දායක වීමට ඇති කැමැත්ත
C - රැකියාවන්ගෙන් ලද අත්දැකීම්
D - ස්ථාවර ආදායමක් ලබා ගැනීමට ඇති කැමැත්ත
E - යම් ක්ෂේත්‍රයක් පිළිබඳ ලබා ඇති අධ්‍යාපනය හා පුහුණුව
F - අවදානම් අවම කර ගැනීමට ඇති කැමැත්ත

ඉහත දැ අතුරෙන් ව්‍යවසායකයකු බිහිවීමට හේතු විය හැකි කරුණු ඇතුළත් සංයෝගය තෝරන්න.
(1) A, B, C, D (2) A, B, C, E (3) A, B, D, E (4) B, C, E, F (5) C, D, E, F (......)

9. A - ව්‍යවහාර මුදල් B - බැංකු මුදල්
C - කලු සල්ලි D - ආසන්න මුදල්
E - විද්‍යුත් මුදල් F - ණය මුදල්

ඉහත සඳහන් දැ අතුරෙන් ශ්‍රී ලංකාවේ භාවිත වන මුදල් වර්ග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, B, C හා D (2) A, B, D හා E (3) A, B, D හා F (4) B, C, D හා E (5) C, D, E හා F (......)

10. පහත වගුවේ X හා Y තීරුවල වෙක්පත් ගනුදෙනුවලට අදාළ තොරතුරු කිහිපයක් දැක්වේ.

X	Y
A. වර්ග B. සම්බන්ධ වන පාර්ශවකරුවන් C. රේඛනය කිරීම	1. අණකරු, අණලද්දා, ආදායකයා 2. සාමාන්‍ය, විශේෂ 3. ධාරක, විධාන

X හා Y තීරුවල දැක්වෙන පද නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A-1, B-3, C-2 (2) A -3, B-2, C-1 (3) A-2, B-1, C-3
(4) A-3, B-1, C-2 (5) A-1, B-2, C-3 (......)

11. පහත සඳහන් ආයතන අතුරෙන් ගිවිසුම්ගත ඉතිරි කිරීම් ආයතනයක් **නොවන්නේ** කුමක් ද?
(1) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල (2) සේවක අර්ථසාධක අරමුදල
(3) විශේෂිත කල්බදු සමාගම් (4) රක්ෂණ සමාගම්
(5) සේවක භාරකාර අරමුදල (......)

12. උපුල් තම මෝටර් රථය රු. මිලියන 3 කට රක්ෂණය කර ඇත. ඔහුගේ මෝටර් රථය හඳුනා නොගත් පුද්ගලයකු විසින් සොරකම් කරන ලදි. රක්ෂණ සමාගම රු. මිලියන 3 ක් ගෙවා උපුල්ගේ වන්දිය පියවන ලදි. දින කිහිපයකට පසු රක්ෂණ සමාගම විසින් මෝටර් රථය සොයාගනු ලැබූ අතර එය රු. මිලියන 3.5 ක වෙළෙඳපොළ වටිනාකමට වෙන්දේසි කරන ලදි. (වෙන්දේසිකරුගේ ගාස්තුව රුපියල් 150 000 කි). ඉන්පසු රක්ෂණ සමාගම විසින් කළ යුතු වන්නේ,
(1) රු. මිලියන 3 ක් තබාගෙන ඉතිරි මුදල උපුල්ට ලබා දීම ය.
(2) රු. මිලියන 3 සහ වියදම් වූ මුදල තබාගෙන ඉතිරි මුදල උපුල්ට ලබා දීම ය.
(3) වෙන්දේසිකරුගේ වියදම ගෙවා ඉතිරි මුදල තබා ගැනීම ය.
(4) මෝටර් රථය මිල දී ගත් තැනැත්තාට ඉතිරි මුදල ලබාදීම ය.
(5) ඉතිරි මුදල රජයට ගෙවීම ය. (......)

13. කොළඹ වරායේ සිට සපුගස්කන්ද තෙල් පිරිපහදු මධ්‍යස්ථානය වෙත ඉන්ධන ප්‍රවාහනය කිරීමට **වඩාත්** සුදුසු පරිවහන මාධ්‍යයන් වන්නේ,
(1) ට්‍රක් රථ, උමං මාර්ග සහ දුම්රිය වේ. (2) නැව්, දුම්රිය සහ ට්‍රක් රථ වේ.
(3) දුම්රිය, නැව් සහ කුඩා අහස් යානා වේ. (4) නල මාර්ග, දුම්රිය සහ බවුසර් වේ.
(5) නල මාර්ග, බවුසර් සහ කුඩා අහස් යානා වේ. (......)

14. පහත සඳහන් කරුණු අතුරෙන් ව්‍යාපාර ගෝලීයකරණය කිරීම සඳහා ප්‍රධාන සාධකය වන්නේ කුමක් ද?
(1) යුරෝපා සංගමය (2) තාක්ෂණය
(3) NAFTA වෙළෙඳ ගිවිසුම (4) රටවල්වල ජනවාර්ගික විවිධත්වය වැඩි වීම
(5) වර්ධනය වූ දේශපාලන ස්ථාවරතාව (......)

15. සාර්ක් (SAARC) සංවිධානයට අයත් සාමාජික රටවල් පමණක් ඇතුළත් වන්නේ පහත කිනම් කාණ්ඩය තුළ ද?
(1) ඔස්ට්‍රියාව, බෙල්ජියම, නේපාලය, ශ්‍රී ලංකාව සහ ලිතුවේනියාව
(2) නෙදර්ලන්තය, පෘතුගාලය, භූතානය, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව
(3) එක්සත් රාජධානිය, රුමේනියාව, ඇෆ්ගනිස්ථානය, ශ්‍රී ලංකාව සහ පකිස්තානය
(4) ඉන්දියාව, ශ්‍රී ලංකාව, ඇෆ්ගනිස්ථානය, පකිස්තානය සහ බංග්ලාදේශය
(5) ග්‍රීසිය, ප්‍රංශය, අයර්ලන්තය, ඉතාලිය සහ භූතානය (......)

16. බලතල (අධිකාරිය) පැවරීම තුළින් ඇති **නොවන** ප්‍රතිඵලය දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) ආසන්නතම ප්‍රධානියාගේ වැඩ ප්‍රමාණය අඩුවීම
(2) ආසන්නතම ප්‍රධානියාගේ පුහුණුව හා සංවර්ධනය වැඩි වීම
(3) යටත් සේවකයන්ගේ වැඩ ප්‍රමාණය අඩු වීම
(4) අභිප්‍රේරණය වූ සේවකයින් ඇති වීම
(5) වෘත්තීය සංවර්ධනයට යටත් සේවකයා සූදානම් කිරීම (......)

17. සැලසුම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු දෑ මොනවා දැ'යි විමසන ලද ප්‍රශ්නයට ශිෂ්‍යයින් කිහිපදෙනෙකු සැපයූ පිළිතුරු පහත පරිදි වේ.

A - ප්‍රායෝගික බව
B - නම්‍යශීලී බව
C - අවස්ථානුකූල සැලසුම් කිරීම
D - නිශ්චිත කාල පරාසයක් සඳහා වීම
E - සම්පත් ලබා ගත හැකි බව

ඉහත කරුණුවලින්, සැලසුම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු දෑ වන්නේ,
(1) A පමණකි. (2) A හා B පමණකි. (3) A, B හා C පමණකි.
(4) A, B, C හා D පමණකි. (5) ඉහත සඳහන් සියලු ම කරුණු ය. (......)

18. පහත සඳහන් පුද්ගලයින් අතුරෙන් කළමනාකරණ කුසලතා හඳුන්වා දුන් පුද්ගලයා කවුරුන් ද?
(1) ඇඩම් ස්මිත් (2) හෙන්රි ෆෝර්ඩ් (3) හෙන්රි මින්ට්ස්බර්ග්
(4) රොබර්ට් එල්. කාට්ස් (5) එෆ්. ඩබ්ලිව්. ටේලර් (......)

19. පහත සඳහන් කරුණුවලින් නිෂ්පාදන ක්‍රියාවලි තීරණවලට බලපෑමක් ඇති **නොකරන** සාධකය වන්නේ,
(1) සේවකයන්ගේ පුහුණු හා නුපුහුණු බව (2) අවශ්‍ය උපකරණ වර්ග
(3) නිපදවිය හැකි නිෂ්පාදන වර්ග (4) සංවිධානය සතු වාහන ප්‍රමාණය
(5) භාවිත කිරීමට සිදුවන මෙහෙයුම් පිරියත සැලසුම් වර්ග (......)

20. පරිගණක ආධාරක නිර්මාණකරණය (CAD) නිසා ඇති **නොවන** වාසිය කුමක් ද?
(1) අපතය අඩුවීම (2) ශුන්‍ය දෝෂ නිෂ්පාදිත බිහිවීම
(3) නිෂ්පාදනය වේගවත් වීම (4) සේව්‍ය-සේවක සම්බන්ධතා වර්ධනය වීම
(5) ඵලදායිතාව වර්ධනය වීම (......)

21. පහත සඳහන් දෑ අතුරෙන් වෙළෙඳ දැන්වීමක සඵලදායිතාව දැන ගැනීමට අලෙවි කළමනාකරුවකු සඳහා වඩා වැදගත් වන තොරතුරු මූලාශ්‍රය කුමක් ද?
(1) අලෙවි දත්ත (2) අලෙවිකරණ ජාලය
(3) වෙළෙඳපොළ පර්යේෂණ (4) අභ්‍යන්තර දත්ත සමුදාය (Internal database)
(5) තරගකරුවන්ගේ ප්‍රතිපෝෂණය (......)

22. පහත සඳහන් දෑ අතුරෙන් දිගුකාලීන අරමුදල් සම්පාදන මාර්ගයක් වන්නේ කුමක් ද?
(1) වෙළෙඳ ණය (2) බැංකු අයිරා (3) කොටස් නිකුතුව
(4) ගෙවිය යුතු වියදම් කල්දැමීම (5) සේවක දිරිගැන්වීම සඳහා කොටස් නිකුතුව (......)

23. සංවිධානයක මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,
(1) ආයතනය විසින් සපයනු ලබන නිෂ්පාදන හෝ සේවාවන්ගේ වර්ගය හා ප්‍රමාණය වැඩි කිරීම ය.
(2) ආයතනය විසින් ගෙවනු ලබන බදු ප්‍රමාණය අවම කිරීම ය.
(3) අයිතිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය (ධනය) උපරිම කිරීම ය.
(4) සේවකයන් විසින් උපයනු ලබන ප්‍රතිදාන උපරිම කිරීම ය.
(5) ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය උපරිම කිරීම ය. (......)

24. රඳවාගත් ඉපැයුම් (Retained earnings) යනුවෙන් අදහස් වන්නේ,
(1) ලාභාංශ ගෙවීමෙන් පසු ආයතනයේ ඉතිරි වූ සමස්ථ ඉපැයුම් වටිනාකමයි.
(2) සමාගමේ ද්‍රවශීලතාවය පිළිබඳ සංඥාවකි.
(3) බැංකුවේ ඇති මුදල් ශේෂය හා සමාන දෙයකි.
(4) ආයතනය වෙළෙඳාමෙන් ඉපැයූ ලාභය වේ.
(5) ව්‍යාපාරයේ වියදම් හා පිරිවැය අඩු කළ පසුව සමාගමේ ඉතිරිවන සමස්ථ ලාභය වේ. (......)

25. අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා කුසලතා හඳුනා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂකවරුන් විසින් නියමානුකූල ව සකස් කර ගන්නා ප්‍රශ්න හඳුන්වන්නේ,
(1) රැකියා විස්තර ප්‍රශ්නාවලිය ලෙස ය. (2) රැකියා පිරිවිතර ප්‍රශ්නාවලිය ලෙස ය.
(3) කුසලතා පරීක්ෂණ ප්‍රශ්නාවලිය ලෙස ය. (4) ව්‍යුහගත ප්‍රශ්නාවලිය ලෙස ය.
(5) රැකියා විශ්ලේෂණ ප්‍රශ්නාවලිය ලෙස ය. (......)

26. අභ්‍යන්තර සේවක ආකර්ෂණය තුළින් ලබාගත හැකි වාසියක් වන්නේ,
(1) නව දැනුම සහිත පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීමට හැකි වීමයි.
(2) සේවකයන් අතර අනවශ්‍යය තරගයක් ඇති වීමයි.
(3) විශාල අයදුම්කරුවන් සංඛ්‍යාවක් ආකර්ෂණය කරගත හැකි වීමයි.
(4) සේවකයන්ගේ ලැදියාව වැඩි වීමයි.
(5) ආකර්ෂණය කර ගැනීමේ වියදම වැඩි වීමයි. (......)

27. පහත සඳහන් දෑ අතුරෙන් ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාලය (LAN) නිවැරදි ව විස්තර කෙරෙන පිළිතුර වන්නේ,
(1) විවිධ භූගෝලීය ප්‍රදේශවල ඇති පරිගණක සම්බන්ධ කිරීම ය.
(2) එකම ගොඩනැගිල්ලක් තුළ ඇති පරිගණක අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ කිරීම ය.
(3) එකම කාර්යාලයේ ඇති මුද්‍රණ යන්ත්‍රයට පරිගණකය සම්බන්ධ කිරීම ය.
(4) රටවල් කිහිපයක ස්ථාපිත කර ඇති පරිගණක අන්තර්ජාලය හරහා සම්බන්ධ කිරීම ය.
(5) ඉහත සඳහන් කිසිවක් නොවේ. (......)

28. පාඨ කථන (Text chatting) සඳහා මූලික අවශ්‍යතාවයක් වන්නේ,
(1) වෙබ් කැමරාවයි (Web camera). (2) යතුරු පුවරුවයි (Keyboard). (3) මවුසයයි (Mouse).
(4) මයික්‍රෆෝනයයි (Microphone). (5) USB ෆ්ලෑෂ් ධාවකයයි (USB Flash drive). (......)

29. පහත දැක්වෙන පාර්ශව අතුරෙන් මනාව සකස් කරන ලද ව්‍යාපාර සැලැස්මක් භාවිත **නොකරන** පාර්ශවය කුමක් ද?
(1) ව්‍යවසායකයින් (2) කළමනාකරුවන් (3) ආයෝජකයින්
(4) සැපයුම්කරුවන් (5) ප්‍රචාරණ ආයතන (......)

30. ව්‍යාපාර සැලැස්මක ඇති 'ව්‍යාපාර විස්තරය' යන අයිතමයේ ඇතුළත් **නොවන** ප්‍රධාන අංගයක් වන්නේ කුමක් ද?
(1) අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තරය (2) ව්‍යාපාරයේ නම හා ලිපිනය (3) විධායක සාරාංශය
(4) සංවිධාන ව්‍යුහය (5) ව්‍යාපාරයේ අරමුණු (......)

2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	...3...	16.	...3...
02.	...1...	17.	...5...
03.	...2...	18.	...4...
04.	...5...	19.	...4...
05.	...4...	20.	...4...
06.	...1...	21.	...3...
07.	...5...	22.	...3...
08.	...2...	23.	...3...
09.	...2...	24.	...1...
10.	...4...	25.	...4...
11.	...3...	26.	...4...
12.	...3...	27.	...2...
13.	...4...	28.	...2...
14.	...2...	29.	...5...
15.	...4...	30.	...3...

වගුව 05

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **60**කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ



ප්‍රස්තාරය 05

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය					
		1	**2**	**3**	**4**	**5**	Missing
1	3	2%	2%	**93%**	2%	1%	-
2	1	**26%**	10%	9%	28%	27%	-
3	2	3%	**86%**	5%	3%	2%	-
4	5	1%	21%	3%	2%	**72%**	-
5	4	6%	11%	3%	**78%**	2%	-
6	1	**96%**	2%	1%	1%	1%	-
7	5	6%	3%	13%	2%	**76%**	-
8	2	2%	**73%**	9%	13%	3%	-
9	2	3%	**85%**	10%	1%	1%	-
10	4	1%	1%	6%	**92%**	0%	-
11	3	13%	3%	**63%**	15%	6%	-
12	3	3%	20%	**69%**	2%	6%	-
13	4	3%	6%	2%	**81%**	8%	-
14	2	2%	**84%**	5%	6%	2%	-
15	4	2%	4%	6%	**85%**	3%	-
16	3	6%	22%	**61%**	5%	6%	-
17	5	2%	6%	4%	18%	**70%**	-
18	4	5%	10%	59%	**19%**	6%	1%
19	4	5%	1%	4%	**85%**	4%	-
20	4	3%	16%	2%	**78%**	1%	-
21	3	27%	13%	**40%**	7%	12%	1%
22	3	20%	7%	**64%**	3%	5%	-
23	3	6%	5%	**83%**	2%	3%	-
24	1	**64%**	8%	4%	3%	22%	-
25	4	7%	43%	38%	**6%**	6%	1%
26	4	14%	2%	4%	**79%**	1%	-
27	2	23%	**51%**	2%	3%	21%	-
28	2	5%	**75%**	1%	14%	4%	-
29	5	18%	4%	15%	19%	**44%**	-
30	3	21%	4%	**65%**	6%	4%	-

වගුව 06

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.
* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය යි.
* I පත්‍රයේ ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා පිළිතුරු සැපයීමේ දී,

  උදා:- 06 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් එනම් 96% ක් නිවැරදි ප්‍රතිචාර දක්වා තිබේ.

  අයදුම්කරුවන්ගෙන් අඩු ම ප්‍රතිශතයක් එනම් 06% ක් නිවැරදි ප්‍රතිචාර දක්වා ඇති ප්‍රශ්නය වන්නේ 25වැනි ප්‍රශ්නය යි. මෙම ප්‍රශ්න 30 අතුරින් පහසුතාව අඩු ම ප්‍රශ්නය වන්නේ 25 වැනි ප්‍රශ්නය යි.

2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා

පළමු පත්‍රයේ ප්‍රශ්න අංක 01-30 දක්වා වූ ප්‍රශ්නවලට අදාළ පහසුතාව අධ්‍යයනය කරන විට අංක 01, 03, 05, 06, 07, 09, 10, 13, 14, 15, 19, 20, 23, 26 සහ 28 යන ප්‍රශ්නවල පහසුතාවය 75%කටත් වැඩි මට්ටමක පවතී. ප්‍රශ්න අංක 02, 18, 21, 25 සහ 29 යන ප්‍රශ්නවල පහසුතාවය 50%කට වඩා අඩු මට්ටමක පවතී (ප්‍රස්තාරය 05). එම ප්‍රශ්නවලට අදාල පාඩම් ඒකක හා එක් එක් ප්‍රශ්නවල පහසුතාවය පහත දැක්වේ.

පාඩම් ඒකක	ප්‍රශ්න අංක	පහසුතාව
01. ව්‍යාපාර පදනම	02	26%
02. ව්‍යාපාර කළමනාකරණය	18	19%
03. අලෙවි කළමනාකරණය	21	40%
04. මානව සම්පත් කළමනාකරණය	25	06%
05. ව්‍යාපාර සැලැස්ම	29	44%

ප්‍රශ්න අංක 02

ඇල්මැති පාර්ශවයන් ව්‍යාපාරය කෙරෙහි උනන්දු වීමට හේතු, ඒ ඒ පාර්ශවයන්ට අදාළව වෙන් වෙන්ව ඉදිරිපත් කිරීමට සිසුන් අපොහොසත් වී ඇති බව පෙනේ. ප්‍රායෝගිකව ඇල්මැති පාර්ශවයන්ට ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට බලපාන හේතු ගවේෂණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදීම වඩා සුදුසු ය.

ප්‍රශ්න අංක 18

ව්‍යාපාර කළමනාකරණය හා සම්බන්ධ විවිධ නිර්වචන, විවිධ සංකල්ප ඉදිරිපත් කළ පුද්ගලයන් පිළිබඳ නිශ්චිත දැනුම සිසුන් තුළ ඉතා අවම මට්ටමක පවතී. එම නිසා එවැනි කරුණු පිළිබඳව නිරවුල් අවබෝධයක් අවශ්‍ය බව පෙනේ.

ප්‍රශ්න අංක 21

අලෙවි කළමනාකරුට අදාළ භූමිකාව හා සම්බන්ධ තොරතුරු මූලාශ්‍රයන් පිළිබඳව දැනුම සෑහීමකට පත්විය නොහැකි මට්ටමක පවතී. එමෙන්ම භූමිකාවට අදාළ සඵලදායකත්වය දැන ගැනීමේ නිශ්චිත මූලාශ්‍රයන් හඳුනාගත යුතු වේ. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ පිළිබඳව වැඩි සැලකිල්ලක් යොමු කළ යුතුය.

ප්‍රශ්න අංක 25

සම්මුඛ පරීක්ෂණයක දී මූලික අපේක්ෂාවන් සඳහා ප්‍රශ්නාවලියක් සකස් විය යුතු ආකාරය පිළිබඳව නිවැරදි අවබෝධයක් සිසුන්ට ලබා දිය යුතුය. අපේක්ෂකයින් අතර සංගතභාවයකින් ඇගයීමක් කිරීමට ව්‍යුහගත ප්‍රශ්නාවලියක් වැදගත් වන බව පැහැදිලි කරගත යුතුය. මෙයට අදාළ නිදසුන් ආශ්‍රයෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් සංවිධානය කර ගත යුතුය.

ප්‍රශ්න අංක 29

ව්‍යාපාර සැලැස්මක් භාවිත කරන පාර්ශවයන් හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දිය යුතුය. ප්‍රායෝගික භාවිතයන් හා පරිචයන් තුළින් ක්‍රමානුකූල අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

31. (අ) ව්‍යාපාර වර්ග හා ව්‍යාපාර වර්ගීකරණ නිර්ණායක සම්බන්ධ දැනුම භාවිත කර පහත වගුව සම්පූර්ණ කරන්න.

විස්තරය	අයිතිය	අරමුණ
1. සේවකයින් දෙදෙනෙකු සේවයේ යෙදී සිටින මැහුම් සාප්පුවක්	පුද්ගලික	....
2. වාණිජ බැංකුවක්	....	ලාභය
3. ඇඳුන් 50 කින් සමන්විත සමූපකාර ආරෝග්‍ය ශාලාවක්	....	....

(ආ) .... හා .... හමුවන සහ සහසම්බන්ධතා පවත්වන ඕනෑම ආකාරයක් වෙළෙඳපොලකි.

පිළිතුරු

(අ)

අයිතිය	අරමුණ
1.	ලාභය
2. පුද්ගලික / පොදු / පුද්ගලික හෝ පොදු	
3. පුද්ගලික	සුභ සාධන / ලාභ අරමුණු කර නොගත්

කරුණු 4ම නිවැරදි නම් ලකුණු 01 යි.
කරුණු 2-3 කට ලකුණු 1/2 යි.
කරුණු 01 නම් ලකුණු නැත.

(ආ) ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් (අලෙවිකරු/සැපයුම්කරු)

(1/2 බැගින් ලකුණු 01යි)

32. (අ) පහතින් ඔබට සපයා ඇත්තේ පලතුරු යුෂ බෝතල්කරණය කරනු ලබන නිෂ්පාදන ආයතනයකට අදාළ තොරතුරු කිහිපයකි.
බෝතල්වලට පලතුරු යුෂ පිරවීම, පලතුරු, සේවකයින් පුහුණු කිරීම, ප්‍රචාරණය, නව යන්ත්‍රයකට ආයෝජනය කිරීම.
ඉහත තොරතුරු පදනම් කරගෙන පහත දැක්වෙන වගුවේ හිස්තැන් පුරවන්න.

යෙදවුම්	ව්‍යාපාර ක්‍රියාවලිය	නිමැවුම්
....	නිෂ්පාදන ඃ............................ අලෙවිකරණ ඃ............................ මානව සම්පත් ඃ............................ මූල්‍ය ඃනව යන්ත්‍රයකට ආයෝජනය කිරීම	පලතුරු යුෂ පිරවූ බෝතල්

(ආ) වර්ෂයක් තුළ රටක සමස්ථ නිෂ්පාදන හා සේවාවන්ගේ මුළු වටිනාකම .... වේ.

පිළිතුරු

(අ) <u>යෙදවුම්</u> — <u>ව්‍යාපාර ක්‍රියාවලිය</u>

පලතුරු — බෝතල්වලට පලතුරු යුෂ පිරවීම
ප්‍රචාරණය
සේවකයන් පුහුණු කිරීම

කරුණු 4කට ලකුණු 01 යි.
2-3 කට ලකුණු 1/2 යි.
කරුණු 01 නම් ලකුණු නැත.

(ආ) දළ දේශීය නිෂ්පාදනය (GDP) / ද.දේ.නි **(ලකුණු 01යි)**

33. (අ) ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීම සඳහා සේවා සපයනු ලබන ආයතන අතුරෙන් IDB යන කෙටි යෙදුමෙන් හඳුන්වනු ලබන ආයතනය .... වන අතර SLBDC කෙටි යෙදුමෙන් හඳුන්වනු ලබන්නේ .... යන ආයතනය වේ.

(ආ) 1. .... 2. .... 3. .... 4. .... ව්‍යවසායකත්ව නිපුණතා (Competencies) කිහිපයක් ලෙස දැක්විය හැක.

පිළිතුරු

(අ) කාර්මික සංවර්ධන මණ්ඩලය
ශ්‍රී ලංකා ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය **(2 x 1/2 බැගින් ලකුණු 01යි)**

(ආ) පරිසර හිතකාමී බව / ආත්ම විශ්වාසය / අධිෂ්ඨානය / දැන සිටීම / අවදානම් දැරීම / සම්පත් සංවිධානය / වැඩට කැපවීම / නව්‍යතා සම්පාදනය / අවස්ථා හඳුනා ගැනීම / නම්‍යශීලී බව/ ගැටළු විසඳීම / ඒත්තු ගැන්වීමේ හැකියාව / ආරම්භ කිරීමේ හැකියාව / අඛණ්ඩතාවය / නායකත්වය / දැක්ම / ජාල සම්බන්ධතාවය / ස්වාධීන බව / අරමුණට ලඟා වීම / සුභවාදී වීම/ නිර්මාණශීලී බව

කරුණු 4කට ලකුණු 01 යි.
2-3 කට ලකුණු 1/2 යි.
කරුණු 01 නම් ලකුණු නැත.

34. (අ) ශ්‍රී ලංකාවේ විශේෂිත මූල්‍ය ආයතන **දෙකක්** ලෙස .... සහ .... හැඳින්විය හැක.

(ආ) සිය ගනුදෙනුකරුවන්ගේ වටිනා භාණ්ඩ හා වැදගත් ලියකියවිලි ආරක්ෂා කරදීම සඳහා වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යනු ලබන සේවාව .... ලෙස හඳුන්වයි.

පිළිතුරු

(අ) කල්බදු සමාගම් / වණික් බැංකු / ඒකක භාර / තැරැව්කරු සමාගම් / ප්‍රාග්ධන ව්‍යවසාය සමාගම් / ප්‍රාථමික වෙළෙඳුන් / ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන **(1/2 x 2 = 01යි)**

(ආ) සුරක්ෂිතාගාර සේවා / ආරක්ෂිත සේප්පු සේවාව **(ලකුණු 01යි)**

35. (අ) .... සහ .... යනු සඵලදායී පණිවුඩයක් සකස් කිරීමේ දී සැලකිය යුතු සාධක **දෙකකි**.

(ආ) ආයතනයක මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් සෙසු කළමනාකරුවන් ඇමතීම .... මෙන්ම .... සන්නිවේදන ක්‍රමයකි.

පිළිතුරු

(අ) පූර්ණ බව / නිවැරදි බව/ අවධානීය බව / සංක්ෂිප්ත බව / ආචාරශීලී බව / පැහැදිලි බව / වේගවත් බව / පිරිමැසුම් බව / නිශ්චිත බව / සැලකිලිමත් බව / අදාල බව

(1/2 x 2 = 01යි)

(ආ) වාචික / අභ්‍යන්තර හෝ විධිමත් **(1/2 x 2 = 01යි)**

ලකුණු 1/2 **ලකුණු 1/2**

36. (අ) ව්‍යාපාර ගනුදෙනුවල දී විද්‍යුත් වෙළෙඳාම සිදුවිය හැකි ආකාර **දෙකක්** ලෙස .... සහ .... දැක්විය හැක.

(ආ) කිසියම් ප්‍රධානියකුගේ අධිකාරී බලය පැවරීම මත යම් කාර්යයක නිරත වන්නා හඳුන්වන්නේ ....ලෙස ය.

පිළිතුරු

(අ)
- ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට (B2B)
- ව්‍යාපාරයෙන් ගනුදෙනුකරුට (B2C)
- ගනුදෙනුකරුගෙන් ගනුදෙනුකරුට (C2C)
- රජයෙන් පුරවැසියන්ට (G2C)

(1/2 x 2 = 01යි)

(ආ) නියෝජිතයා **(ලකුණු 01යි)**

37. (අ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ කොටස් **දෙකක්** ලෙස .... සහ .... හැඳින්විය හැක.

(ආ) භාණ්ඩයක් මිල කිරීමේ අරමුණු **දෙකක්** වන්නේ .... සහ .... ය.

පිළිතුරු

(අ)
- අභ්‍යන්තර අලෙවිකරණය
- සම්බන්ධතා අලෙවිකරණය
- කාර්යඵල / සමාජ වගකීම් අලෙවිකරණය
- සමෝධානික අලෙවිකරණය

(1/2 x 2 = 01යි)

(ආ) • වෙළෙඳපොල තුළ රැඳී සිටීම / පැවැත්ම
- වර්තමාන ලාභ උපරිම කර ගැනීම
- වෙළෙඳපොල කොටස උපරිම කිරීම
- වෙළෙඳපොල සාරය උරා ගැනීම
- නිෂ්පාදිත ගුණත්ව නායකත්වය
- නායකත්ව මිල ක්‍රමය **(1/2 x 2 = 01යි)**

38. (අ) .... සහ .... යනු සම්බන්ධතා අලෙවිකරණය (Relationship Marketing) සම්පූර්ණ කිරීමට අත්‍යාවශ්‍යයෙන් සපුරාලිය යුතු ගුණාංග **දෙකකි.**

(ආ) අතරමැදියෙකු නොමැතිව භාණ්ඩ බෙදා හැරීම .... වේ.

පිළිතුරු

(අ) දිගු කාලීන සම්බන්ධතා සහ පාරිභෝගික තෘප්තිය **(1/2 x 2 = 01යි)**

(ආ) ඍජු අලෙවිකරණය හෝ ඍජු බෙදා හැරීම **(ලකුණු 01යි)**

39. (අ) .... සහ .... නූතන හුවමාරු ක්‍රියාවලියට සහාය වන විවිධ සේවාවන් අතුරෙන් සේවාවන් **දෙකකි.**

(ආ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සිය ව්‍යාපාර සන්නම් .... දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුත්තේ .... පනත යටතේ ය.

පිළිතුරු

(අ) • විද්‍යුත් අලෙවිකරණය
- විද්‍යුත් වාණිජ්‍යය
- විද්‍යුත් බැංකුකරණය
- විද්‍යුත් මුදල්
- දුරකථන හරහා අලෙවිකරණය (Relationship Marketing) **(1/2 x 2 = 01යි)**

(ආ) වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හෝ බුද්ධිමය දේපල කාර්යාංශය **2003** අංක **36** දරණ බුද්ධිමය දේපල සංග්‍රහ පනත (අවුරුද්ද සහ අංකය අවශ්‍යම නොවේ)
(1/2 x 2 = 01යි)

40. (අ) USB ෆ්ලෑෂ් ධාවකයේ වාසි **දෙකක්** වන්නේ .... සහ .... ය.

(ආ) මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ට සැලසුම් හා පාලන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු සපයන පද්ධතිය හඳුන්වනු ලබන්නේ .... නමිනි.

පිළිතුරු

(අ) වේගවත් බව / නැවත භාවිතා කිරීමේ හැකියාව / ගෙන යාමේ පහසුව / පිරිවැය අඩු බව / ගබඩා කළ හැකි වීම / මෘදුකාංග අවශ්‍ය නොවීම / භාවිතය පහසු වීම / කල් පැවැත්ම / හානි අවම වීම **(1/2 x 2 = 01යි)**

(ආ) කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හෝ
කළමනාකරණ උපකාරක පද්ධතිය (MSS) **(ලකුණු 01යි)**

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත** පිළිතුරු සපයන්න.

41. ව්‍යාපාරික පරිසරය අවබෝධ කර ගැනීම සැලසුම්කරණයට ඉතා වැදගත් ය. පහත සඳහන් ප්‍රකාශ ඉදිරියෙන් ඇති හිස්තැන් SWOT ආකෘතියේ දක්නට ලැබෙන ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන යන යෙදුම්වලින් සුදුසු යෙදුම භාවිත කර සම්පූර්ණ කරන්න.

1. ව්‍යාපාර කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් විවෘත වීම :..........................
2. ඔබගේ ව්‍යාපාරය පිහිටි ප්‍රදේශය තුළ නව ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා බොහෝ ආයතන සැලසුම් කිරීම :..........................
3. නව වෙළෙඳපොලවල් සඳහා ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට අවශ්‍ය වන දක්ෂතා ඇති සේවකයින් ආයතනය තුළ නොමැති වීම :..........................
4. ශක්තිමත් ලෙස ස්ථාපිත වී ඇති සමාගමේ භාණ්ඩ සන්නාම :..........................

පිළිතුරු

1. අවස්ථා (O)
2. තර්ජන (T)
3. දුර්වලතා (W)
4. ශක්තීන් (S) **(1/2 x 4 = 02යි)**

42. පාරිභෝගික අයිතිවාසිකම් **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය
- තොරතුරු දැන ගැනීමේ අයිතිය
- තෝරා ගැනීමට ඇති අයිතිය
- සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය
- මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය
- වන්දි ලබා ගැනීමට ඇති අයිතිය
- පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
- සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය

(1/2 x 4 = 02යි)

43. පිළිගත් සමූපකාර ප්‍රතිපත්ති **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
- ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
- සාමාජික ආර්ථික සහභාගීත්වය
- ස්වෛරීභාවය හා නිදහස
- සමූපකාර අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු
- සමූපකාර සමිති අතර සහයෝගීතාව
- සමාජය / ප්‍රජාව පිළිබඳ සැලකිල්ල
- කොටස් ප්‍රාග්ධනයට සීමිත පොලිය
- අතිරික්තය සාමාජිකයන් අතර බෙදීම හෝ සාමාජිකයන්ගේ යහපත උදෙසා ආයෝජනය කිරීම

(1/2 x 4 = 02යි)

44. (අ) අගයක් ලබා දෙන කිසියම් දෙයක් කිරීම සඳහා අවදානම් දැරීමට කැමති පුද්ගලයකුට .... කියනු ලබන අතර, දැනට කරගෙන යනු ලබන ව්‍යාපාරයක සේවය කරමින් නව සොයා ගැනීම් හඳුන්වා දෙමින් වෙනස්කම් ඇති කරන තැනැත්තාට .... කියනු ලැබේ.

(ආ) අපනයන සංවර්ධන මණ්ඩලය මගින් කුඩා ව්‍යාපාර සඳහා ලබා දෙන දිරි ගැන්වීම් .... සහ .... වශයෙන් දැක්විය හැක.

පිළිතුරු

(අ) ව්‍යවසායකයා
අභ්‍යන්තර ව්‍යවසායකයා
(අනුපිළිවෙලින්) **(1/2 x 2 = 01යි)**

(ආ) අලෙවි පහසුකම්
උපදේශන සේවා **(1/2 x 2 = 01යි)**

45. හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzberg) විසින් ඉදිරිපත් කළ අන්තර් පුද්ගල භූමිකාවට අයත් උපභූමිකා දෙකක් නම් කරන්න.

1. .... 2. ....

පිළිතුරු

නායකයා / ප්‍රධානියා / සබඳතා ගොඩ නගන්නා

(1 x 2 = 02යි)

46.



පිළිතුරු



47. (අ) ව්‍යවසායකයෙකු තම භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීමට අපේක්ෂා කරනු ලබන පාරිභෝගික කණ්ඩායම .... නමින් හඳුන්වයි.

(ආ) විනෝදාංශ ලෙස කරනු ලබන කටයුතු ව්‍යාපාරයක් බවට පත්වීම පිළිබඳ ව එක් උදාහරණයක් වන්නේ .... ය.

පිළිතුරු

(අ) ඉලක්ක වෙළෙඳපොල **(1/2 x 2 = 01යි)**

(ආ) විසිතුරු මසුන් / මල් වැවීම / කලාත්මක භාණ්ඩ / කේක් සෑදීම / රූපලාවන්‍ය / මුද්දර එකතු කිරීම / පැරණි කාඩ් එකතු කිරීම / චිත්‍ර / පරිගණක ආශ්‍රිත නිර්මාණ සංගීතය / නැටුම් / රචනා වෙනත්

(1/2 x 2 = 01යි)

48. පහත ඇති හිස්තැන් සුදුසු පද යොදා සම්පූර්ණ කරන්න.

1. මුළු විකුණුම් ආදායම (-) .... = දළ ලාභය
2. දළ ලාභය (+) වෙනත් ආදායම් (-) .... = මෙහෙයුම් වියදම්
3. .... (-) වගකීම් = හිමිකම් ප්‍රාග්ධනය
4. ශුද්ධ ආදායම (÷) හිමිකම් ප්‍රාග්ධනය = ...

පිළිතුරු

1. විකුණුම් පිරිවැය
2. ශුද්ධ ලාභය
3. මුළු වත්කම්
4. හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය / ROE

(1/2 x 4 = 02යි)

49. රක්ෂණ ව්‍යාපාරයේ සඵලදායීතාවයට රක්ෂණ මූලධර්ම වැදගත් වේ. එම රක්ෂණ මූලධර්ම **හතරක්** ලියන්න.

1. .... 2. ....
3. .... 4. ....

පිළිතුරු

- රක්ෂණ හිමිකම
- උපරිම විශ්වාසය
- හානි පූරණය
- දායකත්වය
- ආදේශනය
- ආසන්නම හේතුව

(1/2 x 4 = 02යි)

50. (අ) සේවක වැඩ වර්ජන වර්ග **දෙකක්** නම් කරන්න.

1. .... 2. ....

(ආ) ආයතනයේ ඉතා සුළු නීති රීති පවා අනුගමනය කරමින් ඉතා සුළු වැඩ ප්‍රමාණයක් සිදු කිරීම .... වන අතර මේ නිසා ආයතනයේ .... වැඩි වේ.

පිළිතුරු

(අ) සංකේත වැඩ වර්ජන / අඛණ්ඩ වැඩ වර්ජන **(1/2 x 2 = 01යි)**

(ආ) අකුරට වැඩ කිරීම
පිරිවැය / අකාර්යක්ෂමතාවය **(1/2 x 2 = 01යි)**

2.1.8 I ප්‍රශ්න පත්‍රයේ අංක **31** - **50** තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ



ප්‍රස්තාරය 06

2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය

ප්‍රශ්න අංකය	ලකුණු ලබාගත් ප්‍රතිශතය					
	ලකුණු 0	ලකුණු 0.5	ලකුණු 1	ලකුණු 1.5	ලකුණු 2	ප්‍රතිචාර නොදැක්වූ
31	1%	5%	9%	48%	36%	1%
32	2%	2%	32%	2%	61%	1%
33	29%	41%	23%	4%	1%	3%
34	46%	9%	31%	6%	6%	3%
35	17%	22%	27%	20%	12%	2%
36	61%	4%	26%	1%	5%	4%
37	38%	12%	21%	8%	17%	4%
38	37%	3%	53%	3%	1%	4%
39	57%	25%	12%	1%	1%	4%
40	24%	17%	32%	7%	16%	3%
41	1%	1%	4%	2%	90%	2%
42	8%	8%	9%	11%	64%	1%
43	43%	12%	10%	9%	22%	5%
44	31%	39%	20%	6%	2%	3%
45	39%	2%	13%	1%	41%	5%
46	4%	19%	17%	20%	39%	2%
47	21%	1%	43%	-	31%	3%
48	8%	25%	32%	23%	11%	2%
49	17%	4%	6%	8%	62%	2%
50	47%	24%	18%	5%	3%	4%

වගුව 07

* I පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට ලකුණු ලබාගත් ප්‍රතිශතය ලකුණු 0, ලකුණු 0.5, ලකුණු 01, ලකුණු 1.5 හා ලකුණු 02 තීරුවලින් දැක්වේ.

* ''ප්‍රතිචාර නොදැක්වූ'' යනුවෙන් දක්වා ඇත්තේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොමැති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතයයි.

  උදා :- අයදුම්කරුවන්ගෙන් 90%ක් ප්‍රශ්න අංක 41 සඳහා වැඩිම ලකුණු ලබාගෙන ඇති අතර, අයදුම්කරුවන්ගෙන් අඩු ම ප්‍රතිශතයක් එනම් 1%ක් අඩුම ලකුණු ලබාගෙන ඇති ප්‍රශ්න වන්නේ ප්‍රශ්න අංක 33, 38 හා 39 වේ.

2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා

I පත්‍රයේ සුදුසු වචන යොදා හිස්තැන් පිරවීම සඳහා ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා වෙන්ව ඇත. මෙහි 41 ප්‍රශ්නයට වැඩි සාධන මට්ටමකින් යුතුව සිසුන් විසින් පිළිතුරු සපයා ඇති අතර නිවැරදි පිළිතුරු සැපයීම් ප්‍රතිශතය 90%කි.

මෙම කොටසට අදාළව අඩු සාධන මට්ටමක් පෙන්වා ඇත්තේ ප්‍රශ්න අංක 33, 38 සහ 39 වේ. ඒවායේ පහසුතාව 01%ක් වැනි පහළ මට්ටමක පවතී.

ප්‍රශ්න අංක 33

ව්‍යාපාර අධ්‍යයනය විෂයට අදාළ විවිධ ආයතන හඳුන්වන කෙටි නාමයන් පිළිබඳව දැනුවත්භාවයක් නොමැති බව පෙනේ. එම නිසා පැවරුම් හා ගවේෂණ තුළින් මෙම තත්ත්වය මඟ හරවා ගත හැකිය. එම ආයතන නිකුත් කරන පත්‍රිකා, ලිපි ලේඛන සහ වෙනත් ප්‍රකාශනයන් කියවීම තුළින් කෙටි නාමයන් මතක තබා ගත හැකිය.

ප්‍රශ්න අංක 38

(අ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයෙහි අනුකොටස් පිළිබඳව සිසුන් තුළ මනා අවබෝධයක් නොමැති බව මෙයින් පෙනේ. එමෙන්ම සම්බන්ධතා අලෙවිකරණයේ අත්‍යවශ්‍ය ගුණාංග තේරුම් ගත යුතුයි.

(ආ) භාණ්ඩ බෙදා හැරීමේ ක්‍රම පිළිබඳව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී වැඩි අවධානයක් යොමු කළ යුතුය.

ප්‍රශ්න අංක 39

(අ) තොරතුරු තාක්ෂණය නූතන හුවමාරු ක්‍රියාවලියට සහය වන ආකාරය හා යොදා ගත හැකි ආකාරය පිළිබඳව සිසුන් දැනුවත් කළ යුතුය.

(ආ) සන්නම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ද සිසුන් තුළ ප්‍රමාණවත් සාධන මට්ටමක් දක්නට නැත. මේ පිළිබඳව සිසුන්ගේ දැනුම වැඩි කර ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩමුළු, සම්මන්ත්‍රණ වැනි දේ සංවිධානය කිරීමට කටයුතු කිරීම වඩාත් ඵලදායී වනු ඇත.

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03 කි. මුළු ලකුණු 100 කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.

I කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

II කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතුය.

* එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

* ප්‍රශ්න පත්‍ර දෙක සඳහා අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය සඳහා ලකුණු	=	100
II පත්‍රය සඳහා ලකුණු	=	100
අවසාන ලකුණු	=	200 2
	=	100

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1 හා 4.2 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත.

II පත්‍රය

1 ප්‍රශ්නය

I කොටස

1. (i) සමාජය තුළ ව්‍යාපාර විසින් වැදගත් භූමිකාවන් කිහිපයක් ඉටු කරනු ලැබේ.

(අ) කාර්මික විප්ලවය හේතු කොටගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න.

- මහා පරිමාණ නිෂ්පාදනය
- නව තාක්ෂණ ශිල්ප ක්‍රම බිහිවීම
- සේවා නියුක්ති අවකාශ වැඩිවීම
- කම්හල් ක්‍රමය පිහිටුවීම
- ආර්ථික ක්‍රමය කෘෂිකර්මාන්ත අංශයේ සිට කර්මාන්ත අංශයට මාරුවීම
- කළමනාකරණ ක්ෂේත්‍රයේ දියුණුව
- නාගරිකකරණය
- විවිධ සේවා අංශවල වර්ධනය
- වෙළෙඳපොල ව්‍යාප්ත වීම (දේශීය / විදේශීය)

(කරුණු 04කට ලකුණු 02යි)

(කරුණු විස්තර කර නොමැති නම් ලකුණු 01යි)

(කරුණු 03කට ලකුණු 1/2යි)

(ආ) ව්‍යාපාර විසින් සම්පූර්ණ කරනු ලබන විවිධ පුද්ගල අවශ්‍යතා මොනවාද?

ආහාර	සන්නිවේදනය
නිවාස	ප්‍රවාහනය
වස්ත්‍ර	ආරක්ෂාව
අධ්‍යාපනය	වින්දන කටයුතු
සෞඛ්‍යය	

(ඕනෑම කරුණු 04කට ලකුණු 02යි)

(ii) ශ්‍රී ලංකාවේ පැරණි ආර්ථික ක්‍රියාවලිය තුළ කෘෂිකර්මාන්තය මූලික වුව ද, වර්තමානයේ කෘෂිකර්මාන්තයට අමතර ව විවිධ වූ අංශ වෙත නැඹුරු වීමක් දක්නට ලැබේ.

(අ) මෙම වත්මන් ප්‍රවණතාව සඳහා බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න.

- තාක්ෂණයේ වර්ධනය
- ගෝලීයකරණය
- යටිතල පහසුකම්වල ගැටලු / සංවර්ධනය
- කෘෂිකාර්මික නිෂ්පාදිතයන්ට හොඳ මිලක් නොලැබීම
- ජීවිත රටාව වෙනස්වීම
- ස්වභාවික පාරිසරික බාධාවන්
- වෙනත් සේවාවන්ගෙන් ඇති ඉල්ලුම වැඩිවීම
- රජයේ ප්‍රතිපත්ති වෙනස්වීමෙන් හිතකර බලපෑම් ඇතිවීම
- උගත් තරුණ පරම්පරාවේ වෙනස් වූ අපේක්ෂාවන්
- නාගරික පහසුකම් වැඩිවීම

(ඕනෑම කරුණු 04කට ලකුණු 02යි)

(ආ) 'වාණිජ්‍ය' හා 'ව්‍යාපාර' අතර ඇති සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

වෙළෙඳාම හා ව්‍යාපාර සේවාවල එකතුව වාණිජ්‍ය වේ.
වාණිජ්‍ය හා කර්මාන්තවල එකතුව ව්‍යාපාර වේ. වෙළෙඳාම ව්‍යාපාරවල කොටසකි.

(ලකුණු 02යි)

(iii) පහත දැක්වෙන සංකල්ප යුගල අතර සමාන අසමානකම් විමසන්න.

(අ) වෙළෙඳපොල ස්ථානය (Market Place) හා වෙළෙඳපොල අවකාශය (Market Space)

සමාන	අසමාන
1. හුවමාරුවක් සිදුවීම 2. පාර්ශව දෙකක් හෝ වැඩි ගණනක් පැවතීම 3. මිනිස් අවශ්‍යතා වුවමනා ඉටුවීම	1. වෙළෙඳපොල භෞතික ස්ථානයක් පැවතීම හා භෞතික ස්ථානයක් නොපැවතීම. 2. විද්‍යුත් මාධ්‍ය මගින් සිදු නොවීම හා විද්‍යුත් මාධ්‍ය මගින් සිදු වීම. 3. වෙළෙඳපොල ස්ථානය සීමාසහිතයි. වෙළෙඳපොල අවකාශය පුළුල් ය.

(කරුණු 2 x 1/2 = ලකුණු 01යි) **(කරුණු 2 x 1/2 = ලකුණු 01යි)**

(ආ) කල් පවතින භාණ්ඩ හා පහසු භාණ්ඩ

<u>සමානකම්</u>
අවශ්‍යතා හා වුවමනා ඉටු වේ.
භාණ්ඩ වීම.
පාරිභෝගික භාණ්ඩ වීම. **(ලකුණු 01යි)**

<u>වෙනස්කම්</u>

කල් පවතින භාණ්ඩ	පහසු භාණ්ඩ
• දිගු කාලීන වේ. • තෝරා ගැනීමට කාලයක්, ශ්‍රමයක් ගත කරයි. • නිතර මිලදී නොගනී.	• කෙටි කාලීන වේ. • තෝරා ගැනීමට කාලයක්, ශ්‍රමයක් ගත නොකරයි. • නිතර මිලදී ගනී.

(කරුණු 2 x 1/2 = ලකුණු 01යි)

(iv) ක්ෂණික ආහාර ව්‍යාපාරය (Fast - food business) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන්හි ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වේ.

(අ) ක්ෂණික ආහාර ව්‍යාපාරයේ සීඝ්‍ර වර්ධනයට බලපාන සාර්ව පාරිසරික සාධක මොනවාද?

- සමාජ සංස්කෘතික සාධක
- දේශපාලන නීතිමය සාධක
- තාක්ෂණ සාධක
- ආර්ථික සාධක
- ප්‍රජා සාධක
- ගෝලීය සාධක
- සංවිධාන සංස්කෘතිය

- සංවිධාන ව්‍යුහය
- කළමනාකරුවන්ගේ දක්ෂතා
- සම්පත්

(කරුණු 4කට = ලකුණු 01යි)

(කරුණු 2-3කට = ලකුණු 1/2යි)

(ආ) ක්ෂණික ආහාර ව්‍යාපාරය තුළ තම ගනුදෙනුකරුවන් ආකර්ශනය කර ගැනීම හා රඳවා ගැනීම කෙරෙහි හිතකර ලෙස බලපාන අභ්‍යන්තර පාරිසරික සාධක කෙටියෙන් පැහැදිලි කරන්න.

- සේවකයින්ගේ හිතවත්කම
- හිතකර භෞතික පරිසරය
- ආකර්ෂණශීලී ආයතන බිම් සැකැස්ම
- නිෂ්පාදන විවිධත්ව
- උපාය මාර්ග නිෂ්පාදිත ගුණාත්වය මිල කිරීමේ ප්‍රතිපත්ති
- ක්ෂණික සේවා
- සේවක කාර්යක්ෂමතාවය
- සංවිධාන සංස්කෘතිය

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(v) (අ) ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇතැම් අංශවල ව්‍යාප්තියත් සමඟ සිදුවන ව්‍යාපාර ක්‍රියාකාරකම් මගින් සමාජයට හා ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවවලට අහිතකර බලපෑම් ඇති වේ. එසේ අහිතකර බලපෑම් ඇති කරමින් ව්‍යාප්ත වන අංශ මොනවා දැ'යි කෙටියෙන් විස්තර කරන්න.

- විද්‍යුත් ව්‍යාපාර
  Face book වංචා, මාධ්‍ය අවභාවිතය

- ගෝලීයකරණය
  පරිසර දූෂණය

- ව්‍යාපාර තරගය
  මාධ්‍ය අහිතකර ලෙස භාවිතය

(ඕනෑම කරුණු 2කට 1/2 x 2 = ලකුණු 01යි)

(පැහැදිලි කිරීම් 1/2 x 2 = ලකුණු 01යි)

(ආ) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම ආයතනයකට වැදගත් වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.

- මූල්‍ය වංචා අවම කර ගැනීමට හැකියාවක් ලැබේ.
- සේවකයින්ට සමානව සැලකීමට අවස්ථාව ලැබේ.
- සේවකයින්ගේ තෘප්තිය හා විශ්වාසය වැඩි වේ.
- ආයතනයේ කීර්තිනාමය වැඩි වේ.
- ආයතනයට සේවකයින් ආකර්ශනය පහසු වේ.
- සේවක ප්‍රවාසිතාවය හා ශ්‍රම පිරිවැටුම අඩු වේ.
- යහපත් සේවාව නිසා පාරිභෝගික තෘප්තිය වැඩි වේ.

(ඕනෑම කරුණු 4කට 1/2 x 4 = ලකුණු 02යි)

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



II ප්‍රශ්න පත්‍රයෙහි I කොටසින් වැඩිම සිසුන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නය මෙයයි. 1 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 99%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 51%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 49%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් කොටස් සහ අනුකොටස් 10 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (i) (ආ) වන අතර එහි පහසුතාව 72%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (v) (අ) වන අතර එහි පහසුතාව 41%ක් බවත් සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව පිළිබඳවත් මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

පළමුවන ප්‍රශ්නයේ (V) (අ), (ආ) සහ (iii) (ආ) අනුකොටස් හි පහසුතාව පිළිවෙළින් 41%, 46% හා 49% කි. (V) (අ) අනුකොටසෙහි පහසුතාව පහළ යාමට හේතුව වන්නේ ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව්‍ය අංශයන් පිළිබඳව හා ඒවායේ ව්‍යාප්තියත්, ඒවායේ ක්‍රියාකාරිත්වයත් පිළිබඳ පුළුල් අවබෝධයක් එම ක්‍රියාකාරකම් සමාජයට හා අනෙකුත් පාර්ශවයන්ට අහිතකර බලපෑමක් පිළිබඳ සිසුන්ට ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීමයි . විද්‍යුත් ව්‍යාපාර, ගෝලීයකරණය, ව්‍යාපාර තරගය ආදී ක්ෂේත්‍ර පිළිබඳව කාලීන දැනුම ලබා ගත හැකි අයුරින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

(v) (ආ) අනුකොටසෙහි පහසුතාව පහළ යාමට හේතුව වන්නේ ව්‍යාපාර ආචාර ධර්ම පිළිබඳව අවබෝධය සිසුන්ට තිබුනද එය ව්‍යාපාර ආයතනයකට වැදගත් වන ආකාරය ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමය. එම නිසා සිද්ධි අධ්‍යයන, පැවරුම්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් ආචාර ධර්ම පිළිබඳව සිසුන්ට අවබෝධ කර දිය යුතුය.

(iii) (ආ) අනුකොටසෙහි පහසුතාව පහළ යාමට හේතු වී ඇත්තේ ප්‍රශ්නයේ හරය නිවැරදි ව හඳුනාගෙන පිළිතුරු සැපයීමට නොහැකි වීමය. සංකල්ප යුගල අතර සමානකම් හා අසමානකම් පමණක් පැහැදිලිව පිළිතුරට ඇතුලත් කළ යුතුය. එම නිසා සම්පූර්ණ ප්‍රශ්නයටම පිළිතුරු ලිවීමට සිසුන් පන්ති කාමරය තුළදී පුරුදු පුහුණු කළ යුතුය.

2 ප්‍රශ්නය

2. (i) (අ) නිදහස් වෙළෙඳ කලාපයේ ආයෝජකයින් සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා දෙන පහසුකම් මොනවාද?

- යටිතල පහසුකම්
- බදු සහන
- ආනයන අපනයන පහසුකම්
- විශේෂ වූ නීතිමය සහන
- කොන්දේසි

(ඕනෑම කරුණු 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකා රජය විසින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී යොදා ගන්නා උපකරණ **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.

- පොලී අනුපාතිකය
- සංචිත අවශ්‍යතා වෙනස් කිරීම
- විවෘත වෙළෙඳපොල කටයුතු
- වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම
- ණය සීමා පැනවීම
- යහ පෙළඹවීම

(ඕනෑම කරුණු 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(ii) (අ) වත්මන් සමාජය තුළ සමූපකාර සමිති එතරම් ප්‍රචලිත නොවන්නේ ඇයි දැ'යි විස්තර කරන්න.

- සාමාජික සම්බන්ධතා අඩුකම
- පුද්ගලික අංශයේ ව්‍යාපාර වර්ධනය
- තරග කිරීමේ හැකියාව අඩුවීම
- පාරිභෝගික ලැදියාව අඩුවීම
- කළමනාකරණ දුර්වලතා
- දුර්වල සේවා ගුණාත්වය

(ඕනෑම කරුණු 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(ආ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ අයිතීන් **හතරක්** සඳහන් කරන්න.

- ව්‍යාපාරයේ කටයුතුවලට සහභාගී වීමට ඇති අයිතිය
- ව්‍යාපාරය උපයන ලාභයට දායක වීමට ඇති අයිතිය
- යෙදූ ප්‍රාග්ධනයට පොලී ලබා ගැනීමට ඇති අයිතිය
- සපයන ණය අත්තිකාරම් සඳහා පොලී ලබා ගැනීමට ඇති අයිතිය
- ගිණුම් පොත් පරීක්ෂා කිරීමට ඇති අයිතිය
- හවුලෙන් ඉවත් වීමට ඇති අයිතිය
- හවුල් ගිවිසුමට අනුව කටයුතු කිරීමේ අයිතිය

(ඕනෑම කරුණු 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(iii) විදේශයක සේවා නියුක්තව සිටි කමල්, රුපියල් මිලියනයක තැන්පත් මුදලක් ද සහිත ව ශ්‍රී ලංකාවට පැමිණියේ ය. මේ වන විට ඔහු එම මුදලින් තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටී. නමුත් ඔහුගේ ඇතැම් මිතුරන් උපදෙස් දෙන්නේ මෙම මුදලින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලෙස ය.

ඉහත දැක්වෙන තෝරා ගැනීම් දෙකෙහි ම වාසි හා අවාසි දක්වමින් කමල් විසින් ගත යුතු වඩාත් සුදුසු තීරණය කුමක් දැ'යි පැහැදිලි කරන්න.

තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වාසි

ලාභ තනිවම භුක්ති විඳීමට හැකිය.
තමන්ට කැමති තීරණ ගැනීමට නිදහසක් ඇත.
ආරම්භ කිරීම පහසුය.
ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරගත හැකිය.
ව්‍යාපාරය විසුරුවා හැරීම පහසුය.
බලපවත්වන නීති රීති හා රෙගුලාසි අවම වීම.
පුද්ගල තෘප්තිය අධික වේ.

(ඕනෑම 2කට 1/2 x 2 = ලකුණු 01යි)

තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අවාසි

වගකීම අසීමිතය. තමන්ම වගකීම් දැරිය යුතුය.
තනි තීරණ ගැනීමක් නිසා තීරණ අසාර්ථක වීමට ඇති ඉඩකඩ වැඩිය.
අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
ප්‍රාග්ධන සම්පාදනයේ දී දුෂ්කරතා ඇතිවිය හැකිය.
නෛතික පුද්ගලභාවයක් ව්‍යාපාරයට නොලැබීම.

(ඕනෑම 2කට 1/2 x 2 = ලකුණු 01යි)

හවුල් ව්‍යාපාරයක වාසි

ආරම්භ කිරීම පහසුයි.
වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකිය.
වගකීම කිහිප දෙනෙකු අතර බෙදී යයි.
කිහිප දෙනෙකුගේ දක්ෂතා එකතුවක් නිසා වඩා නිවැරදි තීරණ ගත හැකිය.
අලාභ කිහිප දෙනෙකු අතරේ බෙදී යෑම.

(ඕනෑම 2කට 1/2 x 2 = ලකුණු 01යි)

හවුල් ව්‍යාපාරයක අවාසි

හවුල්කරුවන් අතර මතභේද ඇතිවිය හැකිය.
අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
වගකීම අසීමිතය.
ලාභය කිහිප දෙනෙකු අතරේ බෙදී යෑම.

(ඕනෑම 2කට 1/2 x 2 = ලකුණු 01යි)

(iv) (අ) රජයක් විසින් ව්‍යාපාර සඳහා බලපෑම් කළ හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න.

- යටිතල පහසුකම් හා අත්‍යවශ්‍ය සේවා සැපයීම.
- තරගකරුවෙකු වීම.
- ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- නීති රීති පැනවීම.
- දිරි ගැන්වීම් ලබා දීම.
- බදු අය කරන්නෙකු වීම.
- ගනුදෙනුකරුවෙකු ලෙස.
- නියාමකයෙකු ලෙස.

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(ආ) සමාගමක් සංස්ථාපනය කිරීමේ දී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලියකියවිලි මොනවාද?

- සමාගමේ නාමය පිළිබඳ විස්තර
- සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය
- අධ්‍යක්ෂකවරු ලෙස ක්‍රියා කරන්නන්ගෙන් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලියවිලි
- සමාගමේ ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීමට කැමති බව ප්‍රකාශ කරමින් සමාගමේ ලේකම්වරයාගෙන් ලියවිල්ලක්

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(v) (අ) අක්වෙරළ සමාගම් හා විදේශීය සමාගම් අතර ඇති සමානකම් හා අසමානකම් **දෙක** බැගින් සඳහන් කරන්න.

අක්වෙරළ සමාගම්

සමානකම් :-

- සමාගම් පනත යටතේ ලියාපදිංචිය
- සමාගම් දෙකේම වගකීම් සීමාසහිතය
- නීතිමය පුද්ගලභාවය පැවතීම

(සමානකම් 2කට 1/2 x 2 = ලකුණු 01යි)

අසමානකම් :-

අක්වෙරළ සමාගම්	විදේශීය සමාගම්
• ලියාපදිංචිය මෙරටේ කර විදේශ රටක ව්‍යාපාර කටයුතු කිරීම. • මෙරටේ ව්‍යාපාර කටයුතු තහනම්ය.	• විදේශ රටක ලියාපදිංචි කර මෙරටේ ව්‍යාපාර කටයුතු කිරීම. • මෙරටේ ව්‍යාපාර කටයුතු තහනම් නැත.

(අසමානකම් 2කට 1/2 x 2 = ලකුණු 01යි)

(ආ) පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතු බලතල **දෙකක්** සඳහන් කරන්න.

- වෙළෙඳුන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා සුදුසු පරිදි කටයුතු කිරීමට.
- පාරිභෝගික ආරක්ෂාව සඳහා නිෂ්පාදකයින්ට හා වෙළෙඳුන්ට විශේෂ නියෝග නිකුත් කිරීමට.
- භාණ්ඩ හා සේවාවල ප්‍රමිත ආරක්ෂා කිරීමට අවශ්‍ය විධි විධාන නිකුත් කිරීම.
- පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ පැමිණිලි භාර ගැනීම.
- අධිකාරියේ විධි විධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින අයට විරුද්ධව නීතිමය කටයුතු කිරීමට

(කරුණු 2 x 1 = ලකුණු 02යි)

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



2 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 81%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 5%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 24%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 74%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 26%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 09 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iii) වන අතර එහි පහසුතාව 88%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (ii) (අ) වන අතර එහි පහසුතාව 33%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව පිළිබඳ තොරතුරු මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

2වන ප්‍රශ්නයෙහි (i) (අ), (ii) (අ) සහ (v) (අ) අනුකොටස් හි පහසුතාව පිළිවෙළින් 41%, 33% හා 39% වේ. (i) (අ) අනුකොටසට අවම පහසුතාවක් ලබා ගැනීමට හේතු වී ඇත්තේ නිදහස් වෙළෙඳ කලාපයේ ආයෝජකයින් වෙත ලබා දෙන පහසුකම් පිළිබඳව දැනුම නොමැති වීමය. එම නිසා ආයෝජකයින් වෙත ලබා දෙන විවිධ වූ පහසුකම් වෙන වෙනම හඳුනා ගැනීමට හා පැහැදිලි කිරීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය.

(ii) (අ) අනුකොටසට අඩු පහසුතාවක් ලැබීමට හේතු වී ඇත්තේ සිසුන් විසින් සමූපකාර සමිති සහ සමූපකාර ව්‍යාපාරය අතර ඇති වෙනස හඳුනා නොගෙන පිළිතුරු සපයා තිබීමය. සමූපකාර සමිති සහ සමූපකාර ව්‍යාපාරය අතර ඇති වෙනස පැහැදිලි ව අවබෝධ කර දීමට අවශ්‍ය දැනුම ලබා දිය යුතුය.

(v) (අ) අනුකොටසට අඩු පහසුතාවක් ලැබීමට හේතු වී ඇත්තේ සමානකම් පිළිබඳ අවබෝධය නොමැති වීමයි. සමාන, අසමානකම් හඳුනා ගැනීමට හා පැහැදිලි කිරීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය.

3 ප්‍රශ්නය

3. (i) (අ) කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද?

- වෙළෙඳපොල ස්වභාවය
- නිෂ්පාදිතයේ ස්වභාවය
- ප්‍රාග්ධන සම්පාදනය
- තරගකාරිත්වය
- ව්‍යාපාරයේ ස්වභාවය
- නීතිමය කරුණු
- ස්ව ශක්තිය
- ව්‍යාපාර ස්ථානය
- දිරි ගැන්වීම්

(1/2 x 4 = ලකුණු 02යි)

(ආ) පහත දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
සාර්ථක ව්‍යවසායකයකු වීමේ සිහිනයෙන් පෙලුනු සිරිමල් වයස අවුරුදු 20 දී රු.50 000 ක් ආයෝජනය කරමින් අයිස්ක්‍රීම් ව්‍යාපාරයට අවතීර්ණ විය. මේ වන විට ඔහු මෙම ව්‍යාපාරයට අවශ්‍ය පුහුණුව හා අත්දැකීම් වලින් යුක්ත අතර 5%ක වෙළෙඳපොල කොටසක් අත්පත් කරගෙන සිටියි. ඔහුට අනුව, ඔහුගේ ව්‍යාපාරික නව්‍යකරණයන් සහ පවුලේ සමාජිකයින් හා මිතුරන් සමග එක්ව ගොඩනගා ගත් සම්බන්ධතා ජාලය වර්තමානයේ ඔහු සිටින සාර්ථකත්වයට හේතු වී ඇත. මේ වන විට ඔහුගේ ව්‍යාපාරය තව දුරටත් පුළුල් කළ යුතු දැ'යි ඔහු විසින් සැලකිල්ලට ගනිමින් සිටියි.

1. තම ව්‍යාපාරය තව දුරටත් සාර්ථක කර ගැනීම සඳහා සිරිමල් විසින් ඇති කර ගත යුතු ව්‍යවසායකත්ව නිපුණතා මොනවා ද?

- කළමනාකරණ කුසලතා
- අවදානම් දැරීම
- ජාල සබඳතා හැකියාව
- උපාය මාර්ග චින්තන
- අඛණ්ඩතාවය / නොපසුබට උත්සාහය / අභියෝග භාර ගැනීම
- ක්‍රමානුකූල සැලසුම් කිරීම

(1/2 x 2 = ලකුණු 01යි)

2. තම ව්‍යාපාරයේ සාර්ථකත්වය ලඟා කර ගැනීම සඳහා සිරිමල් විසින් ගත යුතු ඊලග උපාය මාර්ගය වශයෙන් ඔබ යෝජනා කරන්නේ කුමක් ද?

අයිතිය වෙනස් කිරීම
උපාය මාර්ග වෙනස් කිරීම
(වෙළෙඳපොල පුළුල් කිරීම, නිෂ්පාදන ස්වභාවය වෙනස් කිරීම)

(කරුණු 1ට = ලකුණු 01යි)

(ii) (අ) බැංකු මුදල් හා විද්‍යුත් මුදල් අතර ඇති වෙනස්කම් මොනවාදැ'යි උදාහරණ සහිත ව කෙටියෙන් පැහැදිලි කරන්න.

ජංගම ගිණුමේ ශේෂයන්	ලකුණු 1/2
උදා : චෙක්පත්	ලකුණු 1/2
විද්‍යුත් මාර්ග ගනුදෙනු	ලකුණු 1/2
උදා : විවිධ කාඩ්පත්	ලකුණු 1/2

(1/2 x 4 = ලකුණු 02යි)

(ආ) මූල්‍ය අවශ්‍යතා පිළිබඳ සේවාවන් ඉටු කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික බැංකු ආයතන පැවතිය ද, වෙනත් මූල්‍ය ආයතන මගින් ද විශාල වශයෙන් එම සේවා සැපයීම සිදු කරනු ලබයි.

1. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ මූල්‍ය ආයතන වර්ග මොනවා ද?

- මහ බැංකුව
- බැංකු අංශය
- තැන්පතු භාර ගන්නා ආයතන
- අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන
- ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන

(ඕනෑම 2කට 1/2 x 2 = ලකුණු 01යි)

2. බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට නියැලීමට අවසර ලබා දී **නොමැති** ව්‍යාපාරික කාර්යයන් මොනවා ද?

ජංගම ගිණුම් පවත්වාගෙන යෑම
විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීම

(1/2 x 2 = ලකුණු 01යි)

(iii) (අ) කල්බදු සමාගම්වලින් ව්‍යාපාරවලට ලැබෙන ප්‍රයෝජන මොනවා ද?

විශාල වටිනාකමින් යුත් වටිනාකම් මුළු මුදලම නොගෙවා භාවිතයට ඉඩකඩ සැලසීම.
කල්බදු සඳහා ගෙවන කුලිය ආදායම් බද්දෙන් නිදහස් වීම.
යන්ත්‍ර යල් පැනීම නිසා සිදුවන පාඩු හා ප්‍රාග්ධන දුෂ්කරතා මග හැරීම.
ව්‍යාපාරයේ ශේෂ පත්‍රයේ වගකීම් ලෙස ප්‍රදර්ශනය නොවීම.
විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපයීමේ හැකියාව
වත්කම් භාවිත කරමින් කල්බදු වාරික ගෙවිය හැකි වීම.

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(ආ) ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායක ප්‍රාග්ධන සමාගමක් (Venture Capital Company) විසින් සපයනු ලබන සේවා සඳහන් කරන්න.

- මූල්‍ය පහසුකම් සැපයීම
- කොටස් ප්‍රාරක්ෂණ සේවාව
- ණය සම්මේල සේවාව
- ව්‍යාපාරවලට සම්බන්ධ වෙනත් සේවා

(ඕනෑම 2කට 1 x 2 = ලකුණු 02යි)

(iv) (අ) ඇතැම් පුද්ගලයින් විසින් ණය කාඩ්පත් (Credit Cards) භාවිත කිරීම සඳහා මැලිකමක් දක්වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.

- ණය ගැතියෙකු වීමට අකමැත්ත
- වියදම් පාලනය කිරීමට
- අමතර වියදම් දැරීමට අකමැත්ත
- ණයපත් පිළිබඳ නොදැනුවත්කම
- වංචා ඇතිවීමට ඉඩකඩ වැඩිවීම

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(ආ) වාණිජ බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරිකයකුට බැංකු අයිරා පහසුකම හැර ලබාගත හැකි වෙනත් පහසුකම් මොනවා ද?

- ගිණුම් ප්‍රකාශන ලබා ගත හැකිවීම.
- ස්ථාවර නියෝග සේවා ලබා ගත හැක.
- ගිණුමට මුදල් රැස් කරවා ගත හැකිවීම / ප්‍රේෂණ පහසුකම්.
- චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකිවීම.

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(v) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සඳහන් කරන්න.

ආර්ථික සහ මිල ස්ථාවර බව පවත්වාගෙන යෑම.

මූල්‍ය ක්‍රමයේ ස්ථාවර බව පවත්වාගෙන යෑම.

(කරුණු 2ට = ලකුණු 02යි)

(ආ) තම පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා වාණිජ බැංකු විවිධ කාර්යයන්හි නියුක්ති වේ.

1. වාණිජ බැංකු, තම අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදා ගන්නා ප්‍රධාන කාර්යයන් සඳහන් කරන්න.

   - තැන්පත් භාර ගැනීම.
   - ණය පහසුකම් සැලසීම.
   - ආයෝජන සේවා
   - නියෝජිත සේවා

(කරුණු 2ට = ලකුණු 01යි)

2. ව්‍යාපාර සංවර්ධනය සඳහා මූල්‍ය ආයතන කෙසේ දායක වන්නේ දැ'යි කෙටියෙන් පැහැදිලි කරන්න.

   (i) දිගු කාලීන හා කෙටි කාලීන අරමුදල් සැලසීම
   (ii) කල් බදු පහසුකම්
   (iii) රජයේ මූල්‍ය සම්පාදනයට සහාය වීම (රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම)
   (iv) තැන්පතු භාර ගැනීම
   (v) කුලීපිට ගැණුම් සේවාව
   (vi) දේපල වෙළෙඳාම
   (vii) විදේශ විනිමය පහසුකම් සැපයීම
   (viii) උපදේශන සේවා සැපයීම
   (ix) උකස් කටයුතු
   (x) සාධ්‍යකරණය
   (xi) රක්ෂණ කටයුතුවල නිරත වීම
   (xii) වෙනත් ව්‍යාපාරවලට අදාල සේවා

(කරුණු 2ට = ලකුණු 01යි)

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



3 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 57%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. (ප්‍රස්තාරය 02). II ප්‍රශ්න පත්‍රයෙහි I කොටසෙන් අඩුම ප්‍රතිශතයක් තෝරා ගත් ප්‍රශ්නය මෙයයි.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 48%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 52%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 10 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (v) (ආ) (2) වන අතර එහි පහසුතාව 72%කි. එසේම පහසුතාව අඩුම කොටස (iii) (අ) වන අතර එහි පහසුතාව 31%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාවය මෙම ප්‍රස්තාරයෙහි දැක් වේ.

3වන ප්‍රශ්නයෙහි (ii) (ආ) 1, 2 , (iii) (අ) සහ (iv) (ආ) යන අනුකොටස් හි පහසුතාව පිළිවෙළින් 37%, 49%, 31% හා 39% වේ. (ii) (ආ) 1 හා 2 කොටස්වල අඩු පහසුතාවකට හේතු වී ඇත්තේ මූල්‍ය ආයතන වර්ගීකරණය සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල නියැලීමට අවසර ඇති කාර්යයන් පිළිබඳ අවබෝධයක් නොමැති බවය.

මූල්‍ය ආයතන වර්ග කිරීමේ සහ ඒවායේ කාර්යයන් පිළිබඳව නිපුණතාවය වර්ධනය කිරීමට පන්ති කාමරය තුළ ක්‍රියාකාරකම් සංවිධානය විය යුතුය.

(iii) (අ), අනුකොටසට පහසුතාව අඩු වීමට බලපෑ හේතුවක් වන්නේ, කල්බදු සමාගම්වලින් ව්‍යාපාරවලට ලැබෙන ප්‍රයෝජන වෙනුවට කල්බදු ක්‍රමය තුළින් ලැබෙන ප්‍රයෝජන පිළිතුරට ඇතුළත් කිරීමය. එම නිසා ප්‍රශ්නයේ හරය නිවැරදි ව අවබෝධ කරගෙන පිළිතුරු ලිවීමට සිසුන් පුරුදු පුහුණු කළ යුතුය.

(iv) (ආ), අනුකොටසට අඩු පහසුතාවක් ලැබීමට හේතු වී ඇත්තේ ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ලැබෙන ප්‍රයෝජන මිස අයිරා පහසුකම් හැර අනෙකුත් පහසුකම් සඳහන් කිරීමට සිසුන් අපොහොසත් වීමය. සිසුන්ට ප්‍රායෝගික දැනුම ලබා දීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

4 ප්‍රශ්නය

4. (i) සම්පත්ගේ මෝටර් රථය අනතුරකට ලක් වීමෙන් සිදු වූ අලාභය රු. 1 200 000ක් ලෙස තක්සේරු කර ඇත. මෙම මෝටර් රථය රු. 2 000 000ක් වටිනා අතර, එය රු. 1 800 000කට 'SRC' රක්ෂණ සමාගමේ සහ රු. 1 200 000කට 'JSA' රක්ෂණ සමාගමේ රක්ෂණය කර ඇත.

(අ) වාහනයේ සම්පූර්ණ අලාභය රක්ෂණ සමාගම් දෙකෙන් ම ලබා ගත හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

නොහැක.

(ලකුණු 01යි)

රක්ෂණයෙන් කිසි විටෙකත් රක්ෂිතයාට ලාභ ලැබීම වළක්වන බැවින් හානිපූරණය / දායකත්ව මූලධර්මවලට අනුව රක්ෂණ සමාගම් දෙකම මුළු අලාභයට අනුපාතිකව දායක වේ.

(ලකුණු 01යි)

(ආ) ප්‍රතිරක්ෂණය (underwriting) හා ප්‍රාරක්ෂණය (re-insurance) ලෙස හඳුන්වන්නේ කුමක්ද?

ප්‍රතිරක්ෂණය

රක්ෂණ සමාගමක් විසින් භාර ගන්නා ලද රක්ෂණ අවදානමක් එම ආයතන විසින් තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීම.

(ලකුණු 01යි)

ප්‍රාරක්ෂණය

විශාල වටිනාකමක් ඇති වත්කමක් සම්බන්ධයෙන් වන අවදානමක් කොටස් වශයෙන් වෙන්කර රක්ෂණ සමාගම් කිහිපයකට භාර දීම.

(ලකුණු 01යි)

(ii) එළවළු හා පලතුරු ප්‍රවාහනය කිරීමේ දී දුම්රිය හා මහාමාර්ග ප්‍රවාහනය යොදා ගැනීම මගින් ඇතිවිය හැකි වාසි හා අවාසි සංසන්දනය කරන්න.

දුම්රිය

වාසි	අවාසි
• ආරක්ෂාකාරී වීම. • ගාස්තු අඩු වීම. • අවශ්‍ය ලෙස ඇසුරුම් යොදා ගත හැකි වීම. • විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි වීම.	• දිවයින පුරා ව්‍යාප්තව නොතිබීම. • ගමනාන්තය දක්වා යොදාගත නොහැකි වීම. • ඕනෑම විටක යොදාගත නොහැකි වීම. • ප්‍රමාද වීම් නිසා අපතේ යෑම් වැඩිවීම.

2 x 1/2 = 01 **2 x 1/2 = 01**

මහාමාර්ග

වාසි	අවාසි
• රට පුරා ව්‍යාප්තව තිබීම. • අවශ්‍යතාව අනුව මාධ්‍ය තෝරා ගත හැකි වීම. • සුලභතාව. • පුද්ගලික මාධ්‍යයක් යොදාගත හැකි වීම. • පලතුරු අලෙවිය අතරමග කළ හැකිය.	• විශාල තොග ප්‍රවාහනයට අපහසුයි. • ප්‍රමාද වීම. • ඇසුරුම් ප්‍රමිති නොමැති වීම. • අනතුරු බහුල වීම, මාර්ග තදබදය. • අපතේ යෑම් වැඩියි.

2 x 1/2 = 01 **2 x 1/2 = 01**

(iii) ඇඟලුම් කම්හලක ප්‍රධාන කාර්මික ශිල්පියා විසින් ඔහු යටතේ සේවය කරන කාර්මික ශිල්පීන් සමඟ පැවති සාකච්ඡාවක දී යන්ත්‍ර ක්‍රියාවිරහිත වීම අවම කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි. එහෙත් සති දෙකකට පසු කළ නිරීක්ෂණවල දී තවමත් යන්ත්‍ර ක්‍රියාවිරහිතවීම්වල අඩුවක් නොමැති බවත්, ඊට හේතුව කාර්මික ශිල්පීන් වැඩි දෙනෙකු හට තමා විසින් ලබාදුන් උපදෙස් අවබෝධ වී නොතිබීම බවත් ප්‍රධාන කාර්මික ශිල්පියාට අවබෝධ විය.

(අ) ප්‍රධාන කාර්මික ශිල්පියාගේ උපදෙස් සෙසු කාර්මික ශිල්පීන්ට අවබෝධ **නොවීමට** හේතු විය හැකි කරුණු මොනවා ද?

- පණිවුඩය පැහැදිලි නොවීම.
- අවධානය අඩුවීම.
- භාෂාමය ගැටලු මතුවීම.
- නිරූපන හා ප්‍රදර්ශන නොමැතිකම.
- විෂය දැනුමේ ඌණතාවය.
- වාචික අංග චලන නොමැති වීම.
- ඉදිරිපත් කිරීමේ කුසලතා ගැටලු.

(1/2 x 4 = 02යි)

(ආ) "ලිඛිත සන්නිවේදනයට වඩා වාචික සන්නිවේදනය සඵලදායී සන්නිවේදන මාර්ගයක් වේ." ඔබ මෙම අදහසට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

ඔව්	නැත
• තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වීම. • වඩාත් ඉක්මණින් ලබා දිය හැකි වීම. • විස්තරාත්මකව ලබා දිය හැකි වීම. • ප්‍රතිචාර ක්ෂණිකව ලැබීම. • අංග චලනය යොදා ගත හැකිය.	• අදහස් සකස් කර ගැනීමට කාලයක් ඇත. • වැරදි නිවැරදි කර ගැනීමට අවස්ථා ඇත. • ලිඛිත සාක්ෂියකි.

(සාර්ථක පිළිතුරකට ලකුණු 02යි)

(iv) ඔබ පාසල් විවාද කණ්ඩායමේ සාමාජිකයකු යැ'යි ද, ඊළඟ සතියේ 'රටක් භාණ්ඩ ආනයනය කළ යුතුය' යන මාතෘකාව යටතේ පැවැත්වෙන විවාදයකට ඔබ කණ්ඩායම සහභාගී වීමට ඇතැයි ද උපකල්පනය කරන්න.

(අ) ඉහත මාතෘකාවට පක්ෂ ව කරුණු **හතරක්** ලියන්න.

(i) විවිධ භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම
(ii) අන්තර්ජාතික සහයෝගීතාව
(iii) දේශීයව නිපදවිය නොහැකි භාණ්ඩ ආනයනය කළ හැකිවීම
(iv) පිරිවැය වාසි ලැබීම
(v) භාණ්ඩ හිඟය අවම වේ
(vi) ආයෝජන භාණ්ඩ ආනයනය කිරීමෙන් රැකියා ඇති වේ
(vii) මිල උච්චාවචන පාලනය වේ
(viii) ජීවන තත්ත්වය උසස් වේ

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(ආ) ඉහත මාතෘකාවට ප්‍රතිපක්ෂ ව කරුණු **හතරක්** ලියන්න.

- අනවශ්‍ය භාණ්ඩ පරිභෝජනයට පෙළඹීම
- වෙනත් රටවල් මත යැපීමට සිදුවීම
- දේශීය කර්මාන්ත අඩාල වීම
- විදේශයට විනිමය ගලා යාම
- සංස්කෘතික ගැටලු මතුවීම
- සේවා නියුක්ති අවස්ථා අඩුවීම

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(v) (අ) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ තුළ සුපිරි වෙළෙඳසැල් සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ. සුපිරි වෙළෙඳසැල්වලින් පාරිභෝගිකයින්ට ලැබෙන වාසි **හතරක්** ලියන්න.

(i) විවිධ භාණ්ඩ හා සේවා ලබාගත හැකිවීම
(ii) ස්වයං සේවා ක්‍රමය ක්‍රියාත්මක වීම හා තෝරා ගැනීමේ නිදහස වැඩිවීම
(iii) විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතය
(iv) දිනුම් ඇදීම හා ප්‍රසාද ලකුණු හිමිවීම
(v) හිතකර පරිසරයක් තිබීම
(vi) සේවා පවත්වාගෙන යෑම
(vii) වාහන නතර කිරීමේ පහසුකම් තිබීම
(viii) නොගැලපෙන භාණ්ඩ ආපසු භාර දිය හැක
(ix) මානසික තෘප්තියක් ලැබීම

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

(ආ) පාරිභෝගිකයින් තවමත් ව්‍යාපාර ගනුදෙනු සඳහා විද්‍යුත් මාධ්‍ය යොදා ගැනීමට පසුබට වන බවක් දක්නට ලැබේ. මෙම පසුබට වීමට හේතු විය හැකි කරුණු **හතරක්** ලියන්න.

(i) නොදැනුවත් බව
(ii) විශ්වාසය අඩුකම
(iii) ඇතැම් ප්‍රදේශවල ව්‍යාප්තව නොතිබීම
(iv) අමතර පිරිවැයක් දැරීමට සිදුවීම
(v) භාෂාමය ගැටලු
(vi) කාඩ් ලබා ගැනීමේ අවම අවශ්‍යතා ඉදිරිපත් කළ නොහැකි වීම
(vii) තාක්ෂණික ගැටලු

(ඕනෑම 4කට 1/2 x 4 = ලකුණු 02යි)

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 71%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 24%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 64%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 36%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 08 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iii) (ආ) කොටස වන අතර එහි පහසුතාව 73%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (i) (ආ) කොටස වන අතර එහි පහසුතාව 53%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙහි දැක් වේ.

රක්ෂණය, ප්‍රවාහනය, සන්නිවේදනය හා වෙළෙඳාම යන පාඩම් ඒකකවලින් සමන්විත හතරවන ප්‍රශ්නය යහපත් සාධන මට්ටමක පවතී. මෙම ප්‍රශ්නයට අදාළව 60%ට වඩා අඩු සාධන මට්ටමක් පෙන්වා ඇත්තේ (i) (අ), (ආ) සහ (iii) (අ) යන අනුකොටස්වලට ය.

(i) (අ) අනුකොටස සඳහා පහසුතාව 58%කි. අදාළ සිද්ධිය අධ්‍යයනය කර රක්ෂණ මූලධර්ම පිළිබඳ දැනුම භාවිතයෙන් පිළිතුර ගොඩ නගා ඉදිරිපත් කිරීමට අවබෝධය නොමැති බව මෙයින් ගම්‍ය වේ. ප්‍රායෝගික ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් රක්ෂණ මූලධර්ම පිළිබඳ දැනුම යාවත්කාලීන වන පරිදි ඇගයීම් ක්‍රියාත්මක කළ යුතුය.

(i) (ආ) අනුකොටස සඳහා පහසුතාව 53%කි. ප්‍රතිරක්ෂණය හා ප්‍රාරක්ෂණය අර්ථ දැක්වීමට සිසුන් අපොහොසත් වී ඇත. ප්‍රතිරක්ෂණය හා ප්‍රාරක්ෂණය පිළිබඳ හැඳින්වීම්, වෙනස්කම් හා සම්බන්ධතාවය විශ්ලේෂණාත්මකව අවබෝධ කර දිය යුතුය.

(iii) (අ) අනුකොටසෙහි පහසුතාව 56%කි. නිශ්චිත සන්නිවේදන ක්‍රමයන් සහ ඒ ඒ ක්‍රමයන් හි ඵලදායී සන්නිවේදනයට ඇති බාධාවන් පිළිබඳව සිසුන් නිරවුල් ව අවබෝධ කරගෙන නොමැති වීම නිසා නිවැරදි ව පිළිතුරු ලබා දීමට නොහැකි වී ඇත.

II කොටස

5 ප්‍රශ්නය

5. (i) (අ) සංවිධානයක කාර්යක්ෂමතාව හා සඵලදායීතාව මැනීමට යොදා ගත හැකි නිර්ණායක මොනවා ද?

කාර්යක්ෂමතාව	**සඵලදායීතාව**
ඵලදායීතාව	ඉලක්ක අත්කර ගැනීම
යෙදවූ කාලය	ඇල්මැති පාර්ශවගේ පිළිගැනීම
පිරිවැය	ඉල්ලුම
අපතේ යාම්	සම්පත් ලබා ගැනීමේ හැකියාව
ලාභය	සම්පත් සංවර්ධනය
ආදායම / විකුණුම්	පැවැත්ම
(ඕනෑම කරුණු 2ක් සඳහා ලකුණු 01යි)	**(ඕනෑම කරුණු 2ක් සඳහා ලකුණු 01යි)**

(ආ) වර්තමානයේ දී කළමනාකරණය පෙරට වඩා වැදගත් වීමට හේතු විය හැකි කරුණු **හතරක්** ලියන්න.

(i) තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දීමට
(ii) හිඟ සම්පත් උපරිම ප්‍රයෝජන ගැනීමට
(iii) සංකීර්ණත්වයට මුහුණ දීම සඳහා
(iv) විවිධත්වයට මුහුණ දීමට
(v) ඇල්මැති පාර්ශවයන්ගේ අපේක්ෂා ඉටු කිරීමට
(vi) ව්‍යාපාර පරිසර වෙනස්කම්වලට මුහුණ දීමට
(vii) ව්‍යාපාර සමාජ වගකීම් හා ආචාර ධර්ම පරිසර පිළිබඳ සංකල්ප වර්ධනය වීමට
(viii) ජාත්‍යන්තර ගිවිසුම් කොන්දේසි ඉටු කිරීමට
(ix) අක්‍රමවත්ව වැඩ කිරීමේ අවාසි මගහරවා ගැනීමට

(ඕනෑම කරුණු 4ක් සඳහා ලකුණු 02යි)

(ii) ව්‍යාපාර පරිසරයේ ඇති අවිනිශ්චිතභාවය නිසා එක් ව්‍යාපාරිකයකු විසින් සැලසුම් කිරීම යන්න මුදල් හා කාලය නාස්ති කිරීමක් බවට විශ්වාස කරයි.

(අ) එම ව්‍යාපාරිකයා හට සැලසුම්කරණයෙහි වැදගත්කම වටහා දීම සඳහා සැලසුම්කරණයෙහි ඇති වාසි පැහැදිලි කරන්න.

(i) ආයතනයේ ගමන් මග පෙන්වීමට
(ii) ගැටළුවලට කල් තබා සූදානම් වීමේ හැකියාව
(iii) පාලන ක්‍රියාවලිය පහසු කරයි / සැසඳීම පහසු කරයි
(iv) අවිනිශ්චිත හා ගතික පරිසරයට සාර්ථකව මුහුණ දීමට
(v) අනෙකුත් කළමනාකරණ කාර්යයන්ට මග පෙන්වීමට
(vi) ආයතනයේ අඛණ්ඩ පැවැත්ම හා වර්ධනය සඳහා
(vii) අනෙකුත් අංශවල මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය
(viii) වෙනත් ආයතනවලින් පහසුකම් ලබා ගැනීමට
(ix) වෙනත් පාර්ශව දිරි ගැන්වීමට හා ඒ අයට ඒත්තු ගැන්වීම පහසුයි
(x) අනපේක්ෂිත මූල්‍ය අවශ්‍යතා අවම කිරීමට

(කරුණු 4 x 1/2 = ලකුණු 02යි)

(ආ) තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ප්‍රශස්ථ විකල්පය තෝරා ගැනීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක මොනවා ද?

(i) අරමුණුවලට කොතරම් දුරට ගැලපේද යන්න
(ii) ක්‍රියාත්මක කළ හැකි බව
(iii) ඇල්මැති පාර්ශවයන්ගේ පිළිගැනීම
(iv) ශක්‍යතාවය
(v) කාලානුරූප වීම
(vi) ලාභදායිත්වය / පිරිමැසුම් බව (සමාජ හා මූල්‍ය)

(කරුණු 4 x 1/2 = ලකුණු 02යි)

(iii) A හා B සමාගම් දෙකෙහි සංවිධාන සටහන් පහත පරිදි වේ.

A



B



සංවිධානකරණ මූලධර්ම පදනම් කර ගනිමින්, ඉහත සඳහන් A හා B සමාගම්වල සංවිධාන සටහන් දෙකෙහි සමානතා හා අසමානතා විස්තර කරන්න.

මූලධර්ම	සමානතා	අසමානතා	
		A	B
ශ්‍රම විභජනය	√		
පාලන පථය / විධාන දාමය		පුළුල්	පටු
අදීශ නියමය	√	-	-
දෙපාර්තමේන්තුකරණය		භූගෝලීය ශ්‍රිතමය	ශ්‍රිතමය
මධ්‍යගත / විමධ්‍යගත		විමධ්‍යගත	මධ්‍යගත

1 x 2 = 02 **1 x 2 = 02**

(iv) (අ) ඉහළ කළමනාකරුවන් සඳහා වඩාත් වැදගත් වන කළමනාකරණ කුසලතාව කුමක් ද? හේතු දක්වන්න.

මනෝභාවාත්මක / සංකල්පීය කුසලතා

ඉහළ කළමනාකරුවන් තීරණ ගැනීමේ හා සැලසුම් කිරීමේ නිරත වන බැවින් ආයතනය සාර්ථකත්වය සඳහා මෙහෙයවන හෙයින්

(කරුණු 1/2 x 2 = ලකුණු 01යි)

(ආ) ආයතන විසින් තම සේවක අභිප්‍රේරණය සඳහා රුපියල් මිලියන ගණනින් මුදල් වියදම් කරනු ලැබේ. අභිප්‍රේරණය වූ සේවකයින්ගෙන් කළමනාකරණයට ලැබෙන ප්‍රතිලාභ මොනවා ද?

(i) ඵලදායීතාවය ඉහළ නැංවීම
(ii) කාර්මික සම්බන්ධතා වැඩි දියුණු වීම
(iii) සේවක කැපවීම ඉහළ යාම
(iv) ප්‍රවාසිතාවය අඩුවීම
(v) ශ්‍රම පිරිවැටුම අඩුවීම
(vi) ආයතනයේ ප්‍රතිරූපය ඉහළ යාම
(vii) තීරණ ක්‍රියාත්මක කිරීමේ පහසුව
(viii) නව නිර්මාණ බිහි කිරීම

(කරුණු 4 x 1/2 = ලකුණු 02යි)

(v) සේවක අභිමුඛ නායකයින් සේවකයින් සතුටෙන් තබා ගන්නා අතර ම ඔවුන්ගෙන් තම කාර්යය ද ඉටු කරවා ගනු ලැබේ.

(අ) සේවක අභිමුඛ නායකත්වය යනු කුමක් දැ'යි නිර්වචනය කරන්න.

සේවක ශුභ සාධනය, තෘප්තිය හා සම්බන්ධතා පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන නායකත්වයයි.

(ලකුණු 02යි)

(ආ) සඵලදායී නායකයකුගේ ගති ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(i) ස්වයං විනය
(ii) පෞරුෂත්වය
(iii) අධිෂ්ඨානය
(iv) ආත්ම විශ්වාසය
(v) ප්‍රියජනක බව
(vi) බුද්ධිමත් බව
(vii) කැපවීම
(viii) පෙළඹවීමට හැකියාව
(ix) මානසික හා කායික ශක්තිමත් බව

(කරුණු 4 x 1/2 = ලකුණු 02යි)

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



5 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 63%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 3%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 22%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 78%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 9 අතුරෙන් පහසුතාව වැඩිම කොටස වන්නේ (iv) (අ) කොටස වේ. එහි පහසුතාව 63% වේ. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (ii) (ආ) වන අතර එහි පහසුතාව 11% කි. සෙසු අනුකොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙන් දැක් වේ.

ව්‍යාපාර කළමනාකරණය හා සම්බන්ධ පස්වන ප්‍රශ්නය සඳහා සාපේක්ෂව අඩු පහසුතාවයක් පෙන්වා ඇත්තේ (i) (අ), (ii) (ආ) සහ (iii) යන අනුකොටස් සඳහා ය. (i) (අ) අනුකොටසෙහි පහසුතාව 25% කි. ඊට බලපා ඇති හේතුව වන්නේ කාර්යක්ෂමතාවය හා සඵලදායීතාවය අර්ථ දැක්වීම කළ හැකි වුවද ඒවා මැනීමට භාවිත කරන නිර්ණායක පිළිබඳව අවබෝධයක් සිසුන්ට නොතිබීම ය.

(ii) (ආ) අනුකොටසෙහි පහසුතාව 11% කි. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ප්‍රශස්ත විකල්පය තෝරා ගැනීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක සම්බන්ධ ප්‍රමාණවත් සාධන මට්ටමක් සිසුන්ට නොමැති බව පෙනේ. තීරණ ගැනීමේ අනුපිළිවෙළ පිළිබඳ අවබෝධයක් ඇතත් පියවරයන් පිළිබඳ ව අවධානයක් යොමු කර නොමැති බැවින් එම පියවරයන් පිළිබඳ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් යොමු කළ යුතුය.

(iii) අනුකොටසෙහි පහසුතාව 18% කි. එයට හේතුව ප්‍රායෝගික සංවිධාන සටහනක් උපයෝගී කරගෙන කළමනාකරණය හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම සංසන්දනය කිරීමේ විශ්ලේෂණ හැකියාව සිසුන් තුළ නොමැති වීමයි. පන්ති කාමරය තුළදී ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ව්‍යාපාර කළමනාකරණ හා සංකල්ප විශ්ලේෂණය කළ හැකි වන සේ පැවරුම්, ක්‍රියාකාරකම්, නිර්මාණ භාවිත කිරීමට සිසුන් පුරුදු පුහුණු කළ යුතුය.

6 ප්‍රශ්නය

6. (i) (අ) ආරක්ෂිත තොගය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණ දීම සඳහා පවත්වා ගත යුතු තොග ප්‍රමාණය (මෙය අවම තොග මට්ටම ලෙස ද හැඳින්විය හැකිය)

(ලකුණු 01යි)

(ආ) JIT ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ආයතන මුහුණ දෙන බාධක කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) අවශ්‍ය වේලාවට සැපයුම්කරුවන් භාණ්ඩ නොසැපයීම
(ii) භාණ්ඩ ඉක්මණින් සපයා ගැනීමට අවශ්‍ය කෙරෙන යටිතල පහසුකම් නොමැති වීම
(iii) සියලු ආයතන JIT ක්‍රමය අනුගමනය නොකිරීම
(iv) නව තාක්ෂණය භාවිතයට නොගැනීම
(v) සමහර අමුද්‍රව්‍ය සමහර කාලවලට පමණක් සැපයීම

(කරුණු 1 x 3 = ලකුණු 03යි)

(ii) හුවමාරු සම්බන්ධතා සංකල්පය මත (Exchange relationship) වෙළෙඳපොළ නමැති සංකල්පය ගොඩනැගී ඇත.

(අ) හුවමාරු සම්බන්ධතාවක් ගොඩනැඟීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා මොනවා ද?

(i) දෙපාර්ශවයක් සිටිය යුතු වීම.
(ii) එක් එක් පාර්ශවයට වටිනාකමක් ඇති යමක් තිබිය යුතුයි.
(iii) එක් එක් පාර්ශව අතර හුවමාරුවට හා බෙදා හැරීමට හැකියාව තිබීම.
(iv) එක් එක් පාර්ශවයට යමක් පිළිගැනීමට හා ප්‍රතික්ෂේප කිරීමට නිදහසක් තිබීම.
(v) එක් එක් පාර්ශවය අන් පාර්ශව සමඟ ගනුදෙනු කිරීම යෝග්‍ය යැයි විශ්වාස කළ යුතු වීම.

(කරුණු 4 x 1/2 = ලකුණු 02යි)

(ආ) විවිධ වර්ගයේ පාරිභෝගිකයන් කවුරුන්දැ'යි උදාහරණ සහිත ව නම් කරන්න.

1. කාර්මික පාරිභෝගිකයා - උදා : ව්‍යාපාර ආයතන
2. රජයේ පාරිභෝගිකයා - උදා : රාජ්‍ය ආයතන
3. කේවල පාරිභෝගිකයා - උදා : ඕනෑම පුද්ගලයෙක්

(නම් කිරීමට 2 x 1/2 = ලකුණු 01යි)
(උදාහරණ 2 x 1/2 = ලකුණු 01යි)

(iii) පහත දැක්වෙන සංකල්ප යුගල අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(අ) පවුල් සන්නම හා පුද්ගලික සන්නම

පවුල් සන්නම
යම් නිෂ්පාදන ආයතනයක් එකම සන්නමක් යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීම

(ලකුණු 01යි)

පුද්ගල සන්නම
නිෂ්පාදකයා විසින් තම නිෂ්පාදිතය වෙළෙඳුන්ට අලෙවි කළ පසු වෙළෙඳුන් විසින් එම නිෂ්පාදිත සඳහා නිර්මාණය කරගන්නා සන්නම

(ලකුණු 01යි)

(ආ) කළමනාකරණ තොරතුරු පද්ධතිය හා අලෙවිකරණ තොරතුරු පද්ධතිය

කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS)

මධ්‍යම කළමනාකරුවන් විසින් තීරණ ගැනීම සඳහා යොදා ගනු ලබන පද්ධතිය

(ලකුණු 01යි)

අලෙවිකරණ තොරතුරු පද්ධතිය (MIS)

අලෙවිකරණ තීරණ ගැනීම සඳහා පවත්වාගෙන යන තොරතුරු පද්ධතිය

(ලකුණු 01යි)

(iv) ව්‍යාපාර ආයතනයකට අදාළ තොරතුරු පහත පරිදි වේ.

- මුළු සේවක සංඛ්‍යාව 100
- සතියකට මුළු සේවක ගෙවීම් (රු) 4 000
- සතියක මුළු නිමැවුම් (ඒකක) 50 000

පහත දෑ ගණනය කරන්න.

(අ) ඒකකයකට ශ්‍රම වියදම

4 000 / 50 000 = 0.08

(ගණනය කළ ආකාරයට ලකුණු 01යි)

(පිළිතුරට ලකුණු 01යි)

(ආ) ශ්‍රම ඵලදායිතාව

50 000 / 100 = 500

(ගණනය කළ ආකාරයට ලකුණු 01යි)

(පිළිතුරට ලකුණු 01යි)

(v) ප්‍රවර්ධන මිශ්‍රයේ අඩංගු උපාංග කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) ප්‍රචාරණය
(ii) විකුණුම් ප්‍රවර්ධනය
(iii) මහජන සම්බන්ධතා හා ප්‍රසිද්ධිය
(iv) ඉසව් හා පළපුරුද්ද
(v) පෞද්ගලික අලෙවිය
(vi) ඍජු අලෙවිකරණය

(හතරක් නම් කිරීමට ලකුණු 02යි)

(එම හතර පැහැදිලි කිරීමට ලකුණු 02යි)

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



6 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 43%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 33%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 67%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 9 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iv) (ආ) වන අතර එහි පහසුතාව 66%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (ii) (ආ) කොටස වන අතර එහි පහසුතාව 8%කි. සෙසු කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙහි දැක් වේ.

හයවන ප්‍රශ්නයෙහි (i) (ආ), (ii) (ආ) සහ (iv) (අ) යන අනුකොටස් සඳහා ලබා ගෙන ඇති පහසුතාව පිළිවෙළින් 30%, 8% හා 20% වේ. (i) (ආ) අනුකොටසෙහි පහසුතාව අඩු වීමට බලපා ඇත්තේ JIT ක්‍රමය පිළිබඳව සිසුන් දැනගෙන සිටියද, එය ක්‍රියාත්මක කිරීමේ දී අවස්ථානුකූලව බලපාන ගැටලු හා බාධාවන් විශේෂයෙන් ශ්‍රී ලංකාවට අදාලව නිරවුල්ව අවබෝධ කර ගැනීමට නොහැකි වීමයි. එම නිසා ප්‍රායෝගික තත්ත්වයන්ට අදාල දැනුවත්භාවය සිසුන් තුළ තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.

(ii) (ආ) අනුකොටසට 8%ක් වූ අවම පහසුතාවක් ලබා ගැනීමට හේතුව පාරිභෝගිකයන් වර්ග කෙරෙන මූලික පදනම් පිළිබඳව සිසුන් අවබෝධ කරගෙන නොතිබීම ය. මෙම ගැටලුව මඟ හරවා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් සංවිධානය කරගත යුතුය.

(iv) (අ) අනුකොටසට අඩු පහසුතාවක් ලැබීමට හේතුව මෙහෙයුම් කළමනාකරණයට අදාළව ගණිත සූත්‍රයන් පිළිබඳ අවබෝධය මදකම සහ ගණනය කිරීමේ දෝෂයන් වේ. එම නිසා දැනුම හා භාවිතය පිළිබඳව කුසලතාව සිසුන්ට ලබා දිය යුතුය.

7 ප්‍රශ්නය

7. (i) ණය කාඩ්පත් භාවිත කරමින් භාණ්ඩ මිල දී ගන්නා පාරිභෝගිකයින්ට වට්ටම් ලබාදෙන බවට සුපිරි වෙළෙඳසැලක් විසින් දැනුම් දී ඇත.

(අ) ණය කාඩ්පත් භාවිතයේ වාසි හා සීමා පැහැදිලි කරන්න.

වාසි	සීමා
• භාවිතය පහසුය. • ආරක්ෂාකාරී වීම. • නිශ්චිත කාලයක් තුළ පොලී රහිත වීම. • විවිධ වට්ටම් හා ප්‍රතිලාභ හිමිවීම. • ජාත්‍යන්තර පිළිගැනීම.	• අනවශ්‍ය මිලදී ගැනීම් සිදුවීම. • පොලී හා ප්‍රමාද ගාස්තු • වංචනික භාවිතය • තාක්ෂණික ගැටලු • අනුමත වෙළෙඳසැල්වලින් මිල දී ගත්විට උපරිම සීමාවක් පැවතීම.

3 x 1/2 = 1 1/2 **3 x 1/2 = 1 1/2**

(ආ) ශ්‍රී ලංකාවේ භාවිත වන ණය කාඩ්පත් සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න.

VISA / MASTER / AMERICAN EXPRESS (AMEX)

(2 x 1/2 = ලකුණු 01යි)

(ii) කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ සුරැකුම්පත් ගණුදෙණුවන ක්‍රම **දෙක** නම් කර, ඉන් එක් ක්‍රමයක් විස්තර කරන්න.

ATS / DEX

(නම් කිරීමට ලකුණු 02යි)

(DEX නොතිබුන ද ලකුණු ලබා දෙන්න.)

ATS (ස්වයංක්‍රීය ගණුදෙණු ක්‍රමය) - අන්තර්ජාලය හරහා පරිගණක ගත කරන ලද සාමාන්‍ය කොටස් අලෙවියට අදාලව ගණුදෙණු සිදු කරන විද්‍යුත් ක්‍රමය යි.

DEX (ණය සුරැකුම්පත් වෙළෙඳ ක්‍රමය) - සංස්ථාපිත සමාගම්වල හා රජයේ ණය සුරැකුම්පත් අලෙවිය සඳහා නිර්මාණය කරන ලද ස්වයංක්‍රීය ක්‍රමය යි.

(ඕනෑම 1ක් විස්තර කිරීමට ලකුණු 02යි)

(iii) (අ) කාර්මික ආරවුල් ඇති වීමට බලපාන මූලික හේතු **දෙකක්** සඳහන් කරන්න.

(i) සේවක අයිතිවාසිකම් නොලැබීම / දුක් ගැනවිලි පැවතීම
(ii) සේවක වගකීම් පැහැර හැර ඇති බව සේවකයින්ට වැටහීම
(iii) රැකියා ගිවිසුම් කඩ කිරීම
(iv) සාමූහික එකඟතා කඩ කිරීම
(v) සේව්‍ය වගකීම් පැහැර හැර ඇති බව සේවකයන්ට වැටහීම

(2 x 1/2 = ලකුණු 01යි)

(ආ) වෘත්තීය ක්‍රියාමාර්ගයක් සමථයකට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආයතනවලට අනුගමනය කළ හැකි විවිධ ක්‍රමවේද කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කිරීම / සමථයකට පැමිණීම
(ii) එකඟතාවයට පැමිණීම / සාමූහික ගිවිසුම්
(iii) බේරුම්කරුවෙකු මඟින්
(iv) කම්කරු විනිශ්චය සභාවක් මඟින්
(v) කම්කරු උසාවිය මඟින්
(vi) කම්කරු දෙපාර්තමේන්තුව හෝ කම්කරු කොමසාරිස් වෙත පැවරීම
(vii) සාමූහික කේවල් කිරීම

(කරුණු 3ක් නම් කිරීමට 1/2 බැගින් ලකුණු 1 1/2යි)
(පැහැදිලි කිරීමට 3 x 1/2 = ලකුණු 1 1/2යි)

(iv) (අ) මානව සම්පත් සැලසුම් කිරීම මගින් සංවිධානයකට ලැබිය හැකි වාසි **හතරක්** සඳහන් කරන්න.

(i) අනාගත සේවක අවශ්‍යතා නිශ්චය කිරීම
(ii) මානව සම්පත් වඩා කාර්යක්ෂමව හා සඵලදායකව උපයෝජනය කිරීම
(iii) සේවක පිරිවැය අඩුවීම
(iv) සේවකයන් සංවර්ධනය
(v) උපක්‍රමික සැලසුම් සම්පාදනය

(4 x 1/2 = ලකුණු 02යි)

(ආ) කාර්ය සාධන ඇගයීම තුළින් සේවකයන් හට ලබා ගත හැකි වාසි මොනවා ද?

(i) සේවක ඵලදායීතාව වැඩිවීම
(ii) සේවක අභිප්‍රේරණය ඉහළ යාම
(iii) උසස් වීම් ලබා ගැනීමට උදව් කිරීම
(iv) තම ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකිවීම
(v) පුහුණු අවශ්‍යතා හඳුනාගත හැකිවීම
(vi) වැටුප් වර්ධක දීමනාව ලබා ගැනීමට හැකිවීම

(4 x 1/2 = ලකුණු 02යි)

(v) බොහෝ පර්යේෂකයින්ට අනුව ඇඟලුම් කර්මාන්තයෙහි උද්ගතව ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ ඉහළ සේවක පිරිවැටුම ය. මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට ගත හැකි පිළියම් **හතරක්** යෝජනා කරන්න.

(i) සේවක සුභ සාධක පහසුකම් ඇති කිරීම
(ii) ඉහළ වැටුප් හා වරප්‍රසාද ලබා දීම
(iii) සේව්‍ය සේවක සම්බන්ධතා වර්ධනය කිරීම
(iv) සේවක සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
(v) සමාජ තත්ත්වය වර්ධනය කිරීමට කටයුතු කිරීම
(vi) සේවක පවුල් සුභ සාධනය
(vii) රැකියා හා පවුල් ජීවිත තුලිත කිරීම
(viii) සේවක බලගැන්වීම හඳුන්වා දීම
(ix) වැඩ කිරීමට පහසු පරිසරයක් ගොඩ නැගීම

(4 x 1 = ලකුණු 04යි)

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



7 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 68%කි. (ප්‍රස්තාරය 02) II කොටසින් අඩුම සිසු පිරිසක් තෝරාගෙන ඇති ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 4%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 21%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 79%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 8 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (i) (ආ) වන අතර එහි පහසුතාව 78%කි. එසේම පහසුතාව අඩුම කොටස (ii) වන අතර එහි පහසුතාව 13% කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙහි දැක් වේ.

හත්වන ප්‍රශ්නයෙහි (ii), (iii) (අ), (ආ), (iv) (අ) සහ (v) යන අනුකොටස්වලට පහසුතාව පිළිවෙලින් 13%, 40%, 23%, 43% හා 36% වේ.

(ii) අනුකොටස සඳහා අඩු පහසුතාවක් ලැබීමට හේතුව වී ඇත්තේ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ සුරැකුම්පත් ගනුදෙනු වන ක්‍රම පිළිබඳව ප්‍රමාණවත් හා යාවත්කාලීන දැනුමක් සිසුන්ට නොතිබීම ය. එම නිසා ඒ පිළිබඳව ක්ෂේත්‍ර චාරිකා සංවිධානය හා දේශන පැවැත්වීම තුළින් සිසුන් දැනුවත් කිරීමට කටයුතු සංවිධානය කළ යුතුය.

(iii) (අ), (ආ) කොටස් සඳහා අඩු පහසුතාවක් ලැබීමට හේතුව වන්නේ මානව සම්පත් කළමනාකරණයේදී කාර්මික ආරවුල් ඇති වීමට හේතුවන මූලික කරුණු පිළිබඳ අවබෝධය නොතිබීමය. එමෙන්ම වෘත්තීය ක්‍රියාමාර්ගයක් සමථයකට පත් කිරීමේ දී ශ්‍රී ලංකාවේ ව්‍යාපාර භාවිත කරන ක්‍රමවේදයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැති බව පෙනේ. ප්‍රශ්න නිරවුල් ව අවබෝධ කරගෙන පිළිතුරු සැපයීමට සිසුන් පුරුදු පුහුණු කරවීමට පන්ති කාමරය තුළදී ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

(iv) (අ) අනුකොටසට අඩු පහසුතාවක් ලැබීමට හේතුව මානව සම්පත් සැලසුම් කිරීමේ අවශ්‍යතාවය හා එමගින් ලැබිය හැකි වාසි අවාසි පිළිබඳව නිශ්චිත අවබෝධයක් සිසුන් තුළ නොමැති වීමය. ඒ නිසා ඒ පිළිබඳව නිවැරදි අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමට කටයුතු කළ යුතුය.

(v) අනුකොටසට අඩු පහසුතාවක් පෙන්වා ඇත්තේ සේවක පිරිවැටුම යන සංකල්පය නිවැරදි ව තේරුම් නොගැනීමයි. එසේම එම තත්ත්වය වළක්වා ගැනීමට ගත යුතු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි පිළියම්, සිද්ධි අධ්‍යයනයන්, පැවරුම් වැනි ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළදී අවබෝධ කර දිය යුතුය.

8 ප්‍රශ්නය

8. (i) (අ) දත්ත සැකසුම් ක්‍රියාවලියක (Data Processing) ප්‍රධාන කාර්යයන් විස්තර කරන්න.

(i) වර්ගීකරණය
(ii) තේරීම
(iii) ගණනය කිරීම
(iv) සාරාංශකරණය

(2-3 නම් කිරීමට ලකුණු 1/2යි)
(2-3 පැහැදිලි කිරීමට ලකුණු 1/2යි)
(හතරම නම් කිරීම හා පැහැදිලි කිරීමට ලකුණු 01යි)

(ආ) ව්‍යාපාර වර්ධනය සඳහා සමාජ ජාල (Social Network) යොදා ගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) නිෂ්පාදිත ප්‍රවර්ධනය කළ හැකිවීම
(ii) පාරිභෝගික පදනම පුළුල් කරගත හැකිවීම
(iii) පාරිභෝගික ප්‍රතිචාර ක්ෂණිකව දැනගත හැකිවීම
(iv) අදහස් / භාණ්ඩ හුවමාරු කරගත හැකිවීම
(v) ව්‍යාපාරයේ ප්‍රතිරූපය වර්ධනය වීම
(vi) ගෝලීයකරණයට අවතීර්ණ වීම
(vii) සේවක ආකර්ශනය පහසු වීම

(කරුණු 4ක් පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(ii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(i) වඩා නිවැරදි තීරණ ගත හැකිවීම
(ii) කටයුතුවල වැරදි අවම වීම
(iii) ක්‍රියාවලිය කාර්යක්ෂම වීම
(iv) නිමැවුම්වල ගුණාත්මකභාවය ඉහළ යාම
(v) තොරතුරු සඳහා ඉතා විශාල ගබඩා ධාරිතාවක් තිබීම
(vi) තරගකාරිත්වයට මුහුණ දිය හැකිවීම
(vii) ලිපිද්‍රව්‍ය භාවිතය අඩු කිරීම
(viii) පුළුල් වෙළෙඳපොල

(4 x 1 = ලකුණු 04යි)

(iii) (අ) සමච්ඡේදන ලක්ෂ්‍යය (Break even point) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

ව්‍යාපාරයක් ලාභ හෝ අලාභ නොලබන නිෂ්පාදන හෝ අලෙවි මට්ටම

(ලකුණු 01යි)
(සූත්‍රය පමණක් තිබීම ද සෑහේ)

(ආ) ව්‍යවසායකයකු වන ලක්මාල් ඔහුගේ නිෂ්පාදන සම්බන්ධයෙන් පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

- නිෂ්පාදනය කළ සමස්ත භාණ්ඩ ප්‍රමාණය (ඒකක) 10 000
- ඇස්තමේන්තු කළ විකුණුම් වටිනාකම (රු) 1 000 000
- විචල්‍ය පිරිවැය (රු) 600 000
- ස්ථාවර පිරිවැය (රු) 200 000

ඉහත තොරතුරු පදනම් කරගෙන පහත සඳහන් දෑ ගණනය කරන්න.

1. ලාභය

ලාභය = 1 000 000 - 800 000 = රු. 200 000

(ගණනය කිරීමේ පිළිවෙලට ලකුණු 1/2යි)

(පිළිතුරට ලකුණු 1/2යි)

(ලකුණු 01යි)

2. ආයකය

ආයකය = 100 - 60 = රු. 40

(ගණනය කිරීමේ පිළිවෙලට ලකුණු 1/2යි)

(පිළිතුරට ලකුණු 1/2යි)

(ලකුණු 01යි)

3. සමච්ඡේදන ලක්ෂ්‍යය

සමච්ඡේදන ලක්ෂ්‍යය = 200 000 ÷ 40 = ඒකක 5 000

(ගණනය කිරීමේ පිළිවෙලට ලකුණු 1/2යි)

(පිළිතුරට ලකුණු 1/2යි)

(ලකුණු 01යි)

(iv) ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිවර්තනයක් සඳහා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවල (SME) වැදගත්කම පැහැදිලි කරන්න.

(i) වැඩි රැකියා අවස්ථා ජනිත කිරීම
(ii) ජාතික නිෂ්පාදිතය වර්ධනය කිරීම
(iii) මහා පරිමාණ ව්‍යාපාරවලට ද්‍රව්‍ය හා සේවා සැපයීම
(iv) දේශීය හා ප්‍රාදේශීය සම්පත් භාවිතය
(v) ජනතාවගේ ආදායම් විෂමතාවය අවම වීම
(vi) ප්‍රාදේශීය සංවර්ධනය / නගර සංවර්ධනය
(vii) මහ පරිමාණ ව්‍යාපාර අත නොගසන වෙනත් ව්‍යාපාරවලට යොමුවීම
(viii) විදේශ විනිමය ඉතිරි වීම
(ix) නව ව්‍යවසායකයන් බිහිවීම
(ix) නවෝත්පාදන බිහිවීම

(4 x 1 = ලකුණු 04යි)

(v) පහත සඳහන් වගුව ආශ්‍රයෙන් ව්‍යාපාර සැලැස්මක අඩංගු විය යුතු අංග දෙකක් වන විධායක සාරාංශය හා මෙහෙයුම් සැලැස්ම පැහැදිලි කරන්න.

ව්‍යාපාර සැලැස්මක අංග	විස්තරය	අන්තර්ගත එක් කරුණක්
1. විධායක සාරාංශය		
2. මෙහෙයුම් සැලැස්ම		

	විස්තරය	එක් කරුණක්
1. විධායක සාරාංශය	ව්‍යාපාර සැලැස්මක ඇතුලත් මූලික කරුණු සංක්ෂිප්ත කර දක්වන කොටස **(ලකුණු 01යි)**	දැක්ම / මෙහෙවර / වෙළෙඳපොල / මූල්‍ය / මානව සම්පත් / වෙනත් **(ලකුණු 01යි)**
2. මෙහෙයුම් සැලැස්ම	නිෂ්පාදන කටයුතු හා සම්බන්ධ කරුණු විස්තර කෙරෙන කොටස **(ලකුණු 01යි**	නිෂ්පාදන සැලැස්ම / යන්ත්‍රෝපකරණ/ අමුද්‍රව්‍ය / නිෂ්පාදන ක්‍රියාපටිපාටිය / පොදු කාර්ය පිරිවැය / අපතය පාලනය / බිම් සැලැස්ම **(ලකුණු 01යි)**

8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

8 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය



8 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 53%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු	00	-	05	ප්‍රාන්තරයේ	32%ක් ද,
ලකුණු	06	-	10	ප්‍රාන්තරයේ	30%ක් ද,
ලකුණු	11	-	15	ප්‍රාන්තරයේ	28%ක් ද,
ලකුණු	16	-	20	ප්‍රාන්තරයේ	10%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 38%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 62%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.

8 ප්‍රශ්නයේ කොටස්වල හා අනුකොටස්වල පහසුතාව



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 9 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iii) (ආ) (1) වන අතර එහි පහසුතාව 76%කි. එසේම පහසුතාව අඩුම කොටස (i) (අ) වන අතර එහි පහසුතාව 24% කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙහි දැක් වේ.

අටවන ප්‍රශ්නයෙහි (i) (අ), (ආ), (ii) සහ (v) යන අනුකොටස්වල පහසුතාව පිළිවෙලින් 24%, 36%, 41% සහ 48% වේ. (i) (අ) අනුකොටසෙහි පහසුතාව පහළ යාමට හේතු වී ඇත්තේ දත්ත සැකසුම් ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යයන් අවබෝධ කරගෙන නොතිබීමයි. එම නිසා මෙහි එක් එක් කාර්යයන් පිළිබඳව පැහැදිලි කිරීමට ද සිසුන් අපොහොසත් වී ඇත.

පන්ති කාමරය තුළදී දරුවන්ට ව්‍යාපාර තොරතුරු පද්ධතියේ භාවිත කරන න්‍යායාත්මක කරුණු ප්‍රායෝගිකව යොදා ගැනීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් සංවිධානය කරගත යුතුය.

(i) (ආ) අනුකොටසෙහි සමාජ ජාල පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් සිසුන් තුළ පැවතිය ද එම දැනුම ව්‍යාපාර කටයුතු වර්ධනය සඳහා කෙසේ යොදා ගත හැකි දැයි නිශ්චිතව දැක්වීමට සිසුන් අපොහොසත් වී තිබුණි. මේ නිසා තාක්ෂණික දැනුම ව්‍යාපාරයක සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය නව්‍යතාවයකින් සිතා කටයුතු කිරීමට සිසුන් පෙළඹවිය යුතුය.

(ii) අනුකොටසට අදාළව පහසුතාව පහළ යාමට හේතු වී ඇත්තේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය නිවැරදි ව පැහැදිලි කිරීමට සිසුන් අපොහොසත් වීම ය. එම නිසා ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් සිසුන්ට මේ පිළිබඳව අවබෝධය ලබා ගැනීමට පහසු වන සේ ක්‍රියාමාර්ග ගත යුතුය.

(v) අනුකොටසට පහසුතාව පහළ යාමට හේතු වී ඇත්තේ ව්‍යාපාර සැලැස්මක අඩංගු විය යුතු අංග සහ අන්තර්ගතයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සිසුන්ට නොතිබීම ය. එම නිසා පන්ති කාමරය තුළ ප්‍රායෝගිකව ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම තුළින් සිසුන්ගේ දැනුම හා අවබෝධය වර්ධනය කළ හැකි වේ.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01, 02, 03 හා 04 යන ප්‍රශ්න I වන කොටසට අයත් වේ. ප්‍රශ්න 05, 06, 07 හා 08 යන ප්‍රශ්න II කොටසට අයත් වේ. එම කොටස් දෙකෙන් අවම වශයෙන් එක කොටසකින් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු වේ.

I කොටසේ 67%ක් වූ ඉහළම පහසුතාවක් දැකිය හැක්කේ දෙවන ප්‍රශ්නයට වන අතර, අඩුම පහසුතාව වූ 54% දැකිය හැක්කේ තුන්වන ප්‍රශ්නයට ය.

II කොටසේ 47%ක් වූ ඉහළම පහසුතාව අටවන ප්‍රශ්නය සඳහාත්, අඩුම පහසුතාව වූ 37% හත්වන ප්‍රශ්නය සඳහාත් දැකිය හැකි ය.

I වන හා II වන කොටස්වල සමස්ත පහසුතාව විමසා බැලීමේ දී I කොටසේ සමස්ත සාමාන්‍ය පහසුතාව 60%කි. එමෙන්ම II කොටසේ සාමාන්‍ය සමස්ත පහසුතාව 42%කි.

III කොටස

3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස් :

- ⋆ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද කුමන ප්‍රශ්න අනිවාර්ය වේ ද කොපමණ ලකුණු ලැබේ ද කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර, ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන පිළිතුරු ලිවිය යුතුය.
- ⋆ I පත්‍රයේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය දෙකයි.
- ⋆ II පත්‍රයේ I හා II උප කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගෙන මුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය තුනයි.
- ⋆ සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ⋆ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ⋆ ප්‍රශ්න අංක හා අනුකොටස් අංක නිවැරදිව සඳහන් කළ යුතුය.
- ⋆ සියලුම ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ලිවිය යුතුය. ප්‍රශ්න යටතේ දී ඇති තොරතුරුත්, ලබා ගත යුතු පිළිතුරු හෝ සාධනය කළ යුතු ප්‍රතිඵල කවරේ ද යන්නත් පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.
- ⋆ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී දී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතුය.
- ⋆ පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු ලිවීමේදී නිල් පාට හෝ කළු පාට පෑන් පමණක් භාවිත කළ යුතුය. අනෙකුත් පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

විශේෂ උපදෙස් :

- * ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා බහුවරණ ප්‍රශ්න සඳහා නියමිත ස්ථානයේ නිවැරදි වරණයේ අංකය පෑනකින් සටහන් කළ යුතු යි.
- * ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ හිස්තැනෙහි සුදුසු වචන ලියා හිස්තැන් පිරවිය යුතු යි.
- * ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු අදාළ ස්ථානයේ ලිවීම කළ යුතු යි.
- * ඒ ඒ ප්‍රශ්නය යටතේ ප්‍රශ්න අනු කොටස් සියල්ලටම නිවැරදි ඉලක්ක ගත පිළිතුරු ලිවිය යුතු ය.
- * තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව අදාළ කරුණු ඉදිරිපත් කළ යුතු ය.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ ස්වභාවය පිළිබඳ ව ගුරුවරයා ගැඹුරු හා පුළුල් අවබෝධයකින් ද යාවත්කාලීන වූ දැනුමකින් ද යුතුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රවේශ විය යුතුය. ව්‍යාපාර අධ්‍යයනය දිනෙන් දින වෙනස් වන විෂයය කරුණු රාශියකින් යුක්ත වේ. එමනිසා එම වෙනස්වීම් පිළිබඳ ව දැනුවත් වීමට ගුරුවරයා සමත් විය යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයය න්‍යායාත්මක දැනුමෙන් ඔබ්බට විහිදෙන විෂයයකි. එම නිසා එම විෂයයට ආදරය කිරීමටත් එම විෂයය ක්ෂේත්‍රය තුළ ජීවත්වීමටත් (Love & Live) ගුරුවරයා සමත් විය යුතු අතර ඒ සඳහා සිසුන්ට මඟ පෙන්වීමක් ද කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයය උගන්වන ගුරුවරයා පන්ති කාමරය තුළ සිදුවන සාමාන්‍ය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියට අමතරව කණ්ඩායම් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර චාරිකා, ව්‍යාපෘති, ප්‍රදර්ශන, ඉදිරිපත් කිරීම් වැනි ක්‍රියාකාරකම් විෂයය පිළිබඳ ව දැනුවත් කිරීම සඳහා භාවිත කළ යුතුය. විෂයය තුළ පවතින සංකල්ප තහවුරු කිරීමට හැකි සෑම අවස්ථාවකදී ම සිද්ධි අධ්‍යයන් යොදා ගත යුතුය. මෙම ක්‍රියාකාරකම්වලදී සිසුන්ගේ උපරිම සහභාගිත්වය සඳහා ඉඩ සැලසෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

* විෂයය දැනුම තහවුරු කිරීමේදී පහසුකම් අනුව වීඩියෝ දර්ශන, පරිගණක මෘදුකාංග, අන්තර්ජාල භාවිතය වැනි අවස්ථාද බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර වැනි නවීන තාක්‍ෂණික උපක්‍රම ද භාවිත කිරීම වඩා සුදුසුය.

* විෂයය අවබෝධය හා දැනුම යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන, වාර්ෂික අයවැය යෝජනා, විෂයයට අදාළ අණ පනත්, නියෝග, නීතිරීති ආයතනික පහසුකම් සපයන සංවිධානවල නිල ප්‍රකාශන පරිශීලනය කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයේ අභිමතාර්ථ පරීක්ෂා කිරීමේදී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉටුකර ගත යුතු සුවිශේෂී අභිමතාර්ථ පද්ධතියක් ඇත. එම අභිමතාර්ථ ප්‍රධාන වශයෙන් එදිනෙදා ජීවිතයට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප ලබාදෙන පරිදි සකස් කර ඇත. මීට අමතරව අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගෙන ජීවන පුරුදු බවට ඉගෙනුම් ඵලය සකස් විය යුතුය. එම අභිමතාර්ථ සාක්ෂාත් කරගත හැකිවන පරිදි ව්‍යාපාර අධ්‍යයනය විෂය ඉගැන්වීමේදී විවිධ ක්‍රම අනුගමනය කිරීමට ගුරුවරයා සැලකිලිමත් විය යුතුය. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පෙන්වා දෙන මඟපෙන්වීම් ඔස්සේ ගුරුභවතා විසින් උචිත ක්‍රමවේද භාවිත කිරීම සාර්ථක ඉගෙනුම්- ඉගැන්වීම් වැඩ පිළිවෙළකට හේතුවනු ඇත.

* ගුරුවරයා තම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදී සිසුන් ඇගයීමට ලක්කළ යුතුය. පන්ති කාමරය තුළ ශිෂ්‍යයන් ඉගෙනීමෙහි යෙදී සිටින අතරතුරදී ගුරුවරයාට සිසුන්ගේ ඉගෙනුම් හැකියා, නොහැකියා හා ප්‍රවීණතා පිළිබඳ ව අවබෝධ කරගැනීමට එමගින් හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදීම සිසුන්ගේ දුර්වලතා හඳුනා ගෙන ඒ සඳහා ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ගුරුවරයා විසින් සැලසුම් සකසා ගත යුතුය.

* ගුරුවරයා තමන්ගේ දැනුම භාවිත කරමින් කුඩා සිද්ධි අධ්‍යයන නිර්මාණය කර ඒ සඳහා න්‍යායාත්මක දැනුම යොදා ගන්නා ආකාරය සිසුන් සමග සාකච්ඡා කිරීම තුළින් එවැනි ප්‍රශ්න සඳහා සිසුන් සූදානම් කළ හැකිය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයේ II ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය. මෙහි I වන කොටස 12 වන ශ්‍රේණියටත් II වන කොටස 13 වන ශ්‍රේණියටත් අදාළ වේ. සමස්ත ඇගයීම් දෙස බලන විට පෙනී යන්නේ I වන කොටස සඳහා වැඩිපුර ලකුණු ලබා ගෙන ඇති තත්ත්වයක් වුව ද II වන කොටස සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ඇති තත්ත්වයකි. එම නිසා 13 වන ශ්‍රේණියට අදාළ පාඩම් ඒකක කෙරෙහි වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොමු කළ යුතුය. ඒ සමගම II වන කොටසේ ප්‍රශ්නවලට සිසුන් වැඩියෙන් පුරුදු පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව වටහාගත යුතුව ඇත.

* අ.පො.ස. (උසස්.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සපයා ඇති ආකාරය දෙස බලන විට ව්‍යාපාර අධ්‍යයනය විෂයය හා සම්බන්ධ සංකල්ප, පාරිභාෂික පද, නව ප්‍රවණතා පිළිබඳ ව සිසුන් තුළ ඇති දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. එමෙන්ම පිළිතුරු නිවැරදි ව ගළපා පැහැදිලි ව ඉදිරිපත් කිරීමට සිසුන් නිපුණතාව ලබා නොමැති බවද පෙනී යන තවත් කරුණකි. එම නිසා එම කරුණු කෙරෙහි පන්ති කාමර ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතුය.